## 2025 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ගම්පහ
වියදම් ශීර්ෂ අංකය : 256

රු.

| අග්‍රිම ගිණුම් අංකය | 2025 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය 1 | | | අග්‍රිම ලැබීම් 2 | | | අග්‍රිම පියවීම් 3 | | | 2025 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 4 | | | 2025 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව ශේෂය | 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නොපියවූ දළ අග්‍රිම | නොපියවූ අග්‍රිම (නොපියවූ දළ අග්‍රිම හැර) | එකතුව | භාණ්ඩාගාරයෙන් | වෙනත් මූලාශ්‍රවලින් | එකතුව | වියදම් මගින් | මුදල් මගින් | එකතුව | නොපියවූ දළ අග්‍රිම ශේෂය | නොපියවූ අග්‍රිම ශේෂය | එකතුව | *5 | 6 |
| | 1(i) | 1(ii) | 1(iii) | 2(i) | 2(ii) | 2(iii)=2(i)+2(ii) | 3(i) | 3(ii) | 3(iii)=3(i)+3(ii) | 4(i) | 4(ii) | 4(iii)=4(i)+4(ii) | 5=1(iii)+2(iii)-3(iii) | |
| 303/24 | | 3,000,000 | 3,000,000 | - | - | - | - | 3,000,000 | - | - | - | - | - | |
| 303/25 | - | - | - | 13,887,222,000 | 1,940,125,360 | 15,827,347,360 | 14,952,547,787 | 874,799,574 | 15,827,347,360 | - | - | - | - | 22,799,574 |

1. තීරු 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න

(1) අප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2025.12.31 දිනට මුදල් ශේෂය — 22,799,574

(2) වෙනත් හේතු -

**22,799,574**

*මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය 2026.02. 20

ඒසීඒ -4

වියදම් ශීර්ෂ අංකය :256

## 2025 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ගම්පහ

රු.

| තැන්පතු ගිණුමේ නම | තැන්පතු අංකය | 2025 ජනවාරි 01 දිනට ශේෂය | වර්ෂය තුළ බැර කිරීම | වර්ෂය තුළ හර කිරීම | 2025 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|
| ඇප තැන්පත් | 6000-0-0-001-0-061-0 | 305,502 | 8,500 | 309,002 | 5,000 | 5,000 |
| වෙන්ඩර් තැන්පත් | 6000-0-0-002-0-079-0 | 1,808,812 | 4,533,282 | 2,056,846 | 4,285,249 | 4,285,249 |
| සේවා පාර්ශ්වයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු | 6000-0-0-013-0-049-0 | 8,276,618 | 343,953,393 | 313,939,514 | 38,290,496 | 38,290,496 |
| කොන්ත්‍රාත් සඳහා වූ රඳවුම් මුදල් | 6000-0-0-016-0-031-0 | 251,426,567 | 77,373,499 | 191,879,796 | 136,920,270 | 136,920,270 |
| වන්දි ගෙවීම් | 6000-0-0-017-0-010-0 | 814,300,941 | 1,115,456,734 | 1,201,271,332 | 728,486,343 | 728,486,343 |
| ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් | 6000-0-0-018-0-039-0 | 6,416,365 | 28,555,308 | 29,225,744 | 5,745,929 | 5,745,929 |
| | | 1,082,534,805 | 1,569,880,716 | 1,738,682,235 | 913,733,286 | 913,733,286 |

..............................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :2026.02. 20

එල්.ඒ.ඩී.එල්. ගුණසේන
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගම්පහ.

ඒසීඒ-5

# 2025 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වැය ශීර්ෂ අංකය : 256 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :.ගම්පහ

රු.

| අත්තිකාරම් ගිණුමේ නම | අත්තිකාරම් ගිණුම් අංකය | 2025 ජනවාරි 01 දිනට ශේෂය (1) | වියදම්හි උපරිම සීමා රු.140000000 | | ලැබීම්වල අවම සීමා රු. 135000000 | | හර ශේෂයන්ගේ උපරිම සීමා රු. 550000000 | බැරකම් පිළිබඳ උපරිම සීමා රු. ........ | 2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වර්ෂය තුළ හර කිරීම (2) | | වර්ෂය තුළ බැර කිරීම (3) | | ශේෂය 4=(1)+(2)-(3) | | |
| | | | මුදලින් | හර සටහන් මගින් | මුදලින් | හර සටහන් මගින් | | | |
| (1) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 256011 | 459,908,573 | 134,715,408 | 22,006,960 | 145,440,723 | 16,297,019 | 454,893,200 | - | 454,893,200 |
| (2) අනෙකුත් අත්තිකාරම් | - | - | - | - | - | - | - | - | - |
| (3) විවිධ අත්තිකාරම් | - | - | - | - | - | - | - | - | - |
| එකතුව | | 459,908,573 | 134,715,408 | 22,006,960 | 145,440,723 | 16,297,019 | 454,893,200 | - | 454,893,200 |

.........................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :2026.02. 20

එල්.ඩී.බී.එල්. ගුණසේන
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගම්පහ.

ඒසීඒ- 5(ඒ)

## 2025 දෙසැම්බර් 31 දිනට කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වැයදම් ශීර්ෂ අංකය :256 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ගම්පහ

| අත්තිකාරම් අංකය | ව්‍යාපෘති විස්තරය | ගෙවූ දිනය | වවුචර් අංකය | ගෙවූ මුදල (රු.) | 2025.01.01 දිනට ශේෂය (රු.) | 2025 වර්ෂය තුළ අයකිරීම් | | 2025.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | පෙර වර්ෂයට අදාළව | ප්‍රවර්තන වර්ෂයට අදාළව | |
| (1) කුලී අත්තිකාරම් | | | | | | | | |
| උදා. | | | | | | | | |
| 9188-250-0-1-0-1 | - | | - | - | - | - | - | - |
| .................... | | | නොමැත | | | | | |
| .................... | | | | | | | | |
| එකතුව (අ) | - | | - | - | - | - | - | - |
| (2) වැඩ අත්තිකාරම් | | | | | | | | |
| උදා. | | | | | | | | |
| 9188-250-0-2-0-1 | | | | | | | | |
| .................... | | | | | | | | |
| එකතුව (ආ) | - | | - | - | - | - | - | - |
| මුළු එකතුව (අ)+(ආ) | - | | - | - | - | - | - | - |

..........................................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :2026.02. 20

ඒසීඒ- 5(ඕ)

## 2025 දෙසැම්බර් 31 දිනට කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය :256          දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ගම්පහ

| අත්තිකාරම් අංකය | ව්‍යාපෘති විස්තරය | 2025.01.01 දිනට ශේෂය (රු.) | 2025 වර්ෂය තුළ | | 2025.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|---|
| | | | අයකිරීම් (හර) | ගෙවීම් (බැර) | |
| | | (1) | (2) | (3) | 4=1+3-(2) |
| (1) කුලී අත්තිකාරම්<br>උදා.<br>9189-250-0-1-0-1<br>....................<br>.................... | - | නොමැත | - | - | - |
| එකතුව (අ) | - | - | - | - | - |
| (2) වැඩ අත්තිකාරම්<br>උදා.<br>9189-250-0-2-0-1<br>....................<br>.................... | | | | | |
| එකතුව (ආ) | - | - | - | - | - |
| | | | | | |
| මුළු එකතුව (අ)+(ආ) | - | - | - | - | - |

.................................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2026.02. 20

එල්.ටී.බී.එල්. ගුණසේන
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගම්පහ.

## Cumulative Non Financial Asset Accounts Report- Central Govt-2025

FINAL 2025

**Land-9153:** 1,022,071,500.00 Table: SA 82
**Building- 9151:** 2,083,656,293.55 Year: 2025
**Machinary-9152:** 795,531,913.26 Rpt Date 2/16/2026 2:18:52 PM
**WIP-9160:** 4,303,555,075.91 Head 256
**Intangible-9154:** 0.00
**Lease-9180:** 0.00

| Ledger | category | Item | Code | Opn_Bal | Opn_Bal_Add | TransferIn | Purchase | Disposal | Balance |
|---|---|---|---|---|---|---|---|---|---|
| 9151 | 1.1-Dwellings | | 61111 | 30,116,359.89 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 30,116,359.89 |
| | | Quarters | ****6111107 | 30,116,359.89 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 30,116,359.89 |
| 9151 | 1.2-Non Residential Building | | 61112 | 1,099,163,087.05 | 1,133,624,413.68 | 0.00 | 648,958,414.90 | 828,205,981.97 | 2,053,539,933.( |
| | | Office Building | ****6111201 | 1,099,163,087.05 | 1,133,624,413.68 | 0.00 | 648,958,414.90 | 828,205,981.97 | 2,053,539,933.( |
| 9160 | 1.4-WIP-Building & Structure | | 61114 | 4,190,906,332.00 | 85,000.00 | 0.00 | 112,563,743.91 | 0.00 | 4,303,555,075.! |
| | | WIP-Building & Structure | ****611140 | 0.00 | 0.00 | 0.00 | 6,129,238.31 | 0.00 | 6,129,238.31 |
| | | Office Building | ****611148 | 4,190,906,332.00 | 85,000.00 | 0.00 | 106,434,505.60 | 0.00 | 4,297,425,837.( |
| 9152 | 2.1-Transport Equipment | | 61121 | 260,650,800.00 | 287,339,800.00 | 0.00 | 0.00 | 164,821,800.00 | 383,168,800.00 |
| | | Passenger vehicle | ****6112101 | 108,740,000.00 | 125,500,000.00 | 0.00 | 0.00 | 107,040,000.00 | 127,200,000.00 |
| | | Cargo vechicle | ****6112102 | 114,981,800.00 | 158,000,000.00 | 0.00 | 0.00 | 57,781,800.00 | 215,200,000.00 |
| | | Agricultural vehicle | ****6112103 | 36,729,000.00 | 3,839,800.00 | 0.00 | 0.00 | 0.00 | 40,568,800.00 |
| | | Motor cycle | ****6112109 | 200,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 200,000.00 |
| 9152 | 2.2-Other Machinary & Equipment | | 61122 | 356,802,005.75 | 13,417,688.61 | 2,412,755.00 | 44,664,587.53 | 4,933,923.63 | 412,363,113.26 |
| | | Office Equipment | ****6112201 | 53,247,065.56 | 3,033,012.35 | 707,019.26 | 7,394,448.83 | 1,602,336.38 | 62,779,209.62 |
| | | Computer Equipment | ****6112202 | 108,707,029.02 | 8,452,151.72 | 1,352,535.74 | 21,701,528.89 | 2,187,606.08 | 138,025,639.29 |
| | | Electrical Equipment | ****6112203 | 2,749,652.63 | 199,999.00 | 0.00 | 538,661.90 | 8,000.00 | 3,480,313.53 |
| | | Communication Equipment | ****6112204 | 14,367,752.17 | 864,640.00 | 0.00 | 1,605,390.00 | 112,000.00 | 16,725,782.17 |
| | | Furniture | ****6112205 | 175,353,539.37 | 867,885.54 | 353,200.00 | 13,356,957.91 | 968,241.17 | 188,963,341.65 |
| | | Medical Equipment | ****6112207 | 399,635.00 | 0.00 | 0.00 | 0.00 | 55,740.00 | 343,895.00 |
| | | Sports equipment | ****6112208 | 46,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 46,000.00 |
| | | Paintings Sculptures & other Antiques | ****6112209 | 27,270.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 27,270.00 |
| | | Books Periodical & Journals | ****6112210 | 3,600.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 3,600.00 |
| | | Industrial & Manufacturing Equipment | ****6112212 | 14,310.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 14,310.00 |
| | | Construction Eqipment | ****6112213 | 261,802.00 | 0.00 | 0.00 | 22,000.00 | 0.00 | 283,802.00 |
| | | Defence Equipment | ****6112215 | 1,511,000.00 | 0.00 | 0.00 | 45,600.00 | 0.00 | 1,556,600.00 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | Agricultural & Dairy Farm Equipment | ****6112216 | 58,850.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 58,850.00 |
| | | Fire Protection Equipment | ****6112217 | 54,500.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 54,500.00 |
| 9153 | 4.1-Land | | 61410 | 1,001,787,000.00 | 20,284,500.00 | 0.00 | 0.00 | 0.00 | 1,022,071,500.( |
| | | Land | ****614100 | 1,001,787,000.00 | 20,284,500.00 | 0.00 | 0.00 | 0.00 | 1,022,071,500.( |

REMARKS

This is a computer-generated document. No signature is required.

-

Report Generated by the new CIGAS Web Application–Developed by Department of State Accounts, Ministry of Finance Planing and Economic Development.

## අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | |
| අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද වියදම් | 9,699,452,792 | |
| අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම් වෙනුවෙන් කරන ලද හර කිරීම් | 1,938,562 | |
| අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් | 15,977,444 | 9,717,368,798 |
| අඩු කළා : | | |
| අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්, වාර්තාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම් | 321,824,726 | |
| වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය වෙනුවෙන් දරන ලද වියදම් | 12,558,850 | |
| අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම් වෙනුවෙන් කරන ලද බැර කිරීම් | 26,645,499 | |
| අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම් | 204,165 | 361,233,241 |
| 2025 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය | | 9,356,135,557 |

* ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කළ හැක.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන් තුව | අවසන් ඇස්තමේන් තුව | | |
| 1002-07-00 | පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තු මුද්දර ගාස්තු | | | 275 | |
| 1003-07-02 | රෙජිස්ටාර් ජනරාල්ගේ ලියාපදිංචි කිරීමේ ගාස්තු. | | | - | - |
| 1003-07-03 | පෞද්ගලික දැව ප්‍රවාහන ගාස්තු. | | | 1386 | - |
| 1003-07-05 | ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තු. | | | 5290 | - |
| 1003-07-99 | අනෙකුත් ගාස්තු. | | | 15553 | - |
| 2002-01-01 | රජයේ ගොඩනැගිලි කුලී. | 6250 | 6100 | 10719 | 176 |
| 2002-02-99 | වෙනත්ආදායම්. | 20000 | 18000 | 19336 | 107 |
| 2003-99-00 | අනිකුත්ලැබීම්. | 8000 | 25000 | 28457 | 114 |
| 2003-02-99 | විවිධ. | 13000 | 40000 | 42343 | 106 |
| 2003-02-03 | හැඳුනුම්පත් ගාස්තු. | | | 36831 | - |
| 2003-02-13 | විභාග හා අනිකුත් ගාස්තු. | | | 16 | - |
| 2003-02-14 | මෝටර්රථ ප්‍රවාහන පනත යටතේ අය කිරීම්. | | | 3119 | - |
| 1003-07-04 | මෝටර් වාහන විකුණුම් මත බදු ආදායම | | | - | - |
| 2003-04-00 | රජයේ නිලධාරින්ට යතුරුපැදි ලබා දීම. | | | - | - |
| 2004-01-00 | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අය කිරීම්. | | | 158280 | - |
| 2006-02-01 | ප්‍රාග්ධන වත්කම් ආදායම්(වාහන). | | | - | - |
| 2006-02-02 | ප්‍රාග්ධන වත්කම් ආදායම්(අනෙකුත්). | | | 221 | - |
| | **එකතුව** | | | **321825** | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්ථන වියදම් | 2,947,000 | 3,149,200 | 3,072,586 | 98 |
| | | | | |
| ප්‍රාග්ධන වියදම් | 432,000 | 455,800 | 419,915 | 92 |

**3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

| විෂය අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල්ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 001 | ජනාධිපති කාර්යාලය | ජංගම සේවයේ හා ව්‍යාපෘති වියදම් | 6126 | 3779 | 3627 | 96 |
| 020 | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ රාජකාරී වෙනුවෙන් ගෙවීම් | 40054 | 40054 | 40053 | 100 |
| 021 | විගණකාධිපති දෙපාර්තමේන්තුව | ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | 694 | 694 | 694 | 100 |
| 101 | බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 15818 | 13218 | 13107 | 99 |
| 102 | මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | වැඩිහිටි,ආබාධිත, වකුගඩු, සියවස් පූර්ණ දීමනා,හා අස්වැසුම | 3008929 | 3008929 | 2976657 | 99 |
| 103 | ආරක්ෂක අමාත්‍යාංශය-ආපදා කළමනාකරණ අංශය | ස්වභාවික ආපදා හානි | 5703263 | 4663303 | 4326564 | 93 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 110 | අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 41774 | 40351 | 30421 | 75 |
| 111 | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 17752 | 17752 | 17177 | 97 |
| 112 | විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 14681 | 12903 | 11575 | 90 |
| 117 | ප්‍රවාහන, මහා මාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය | ව්‍යාපෘති වියදම් | 356068 | 356068 | 304063 | 85 |
| 118 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 74319 | 68066 | 66242 | 97 |
| 123 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 450 | 450 | 446 | 99 |
| 124 | ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 78969 | 78969 | 70528 | 89 |
| 126 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 673 | 673 | 437 | 65 |
| 130 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 3101 | 3101 | 2656 | 86 |
| 149 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 65236 | 65236 | 63205 | 97 |
| 151 | ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය | පරිපාලන වියදම් හා වන්දි මුදල් | 4919 | 4737 | 4737 | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 160 | පරිසර අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 6256 | 6256 | 5811 | 93 |
| 171 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 883149 | 883149 | 846081 | 96 |
| 186 | ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 14543 | 14543 | 14411 | 99 |
| 189 | මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 335 | 335 | 291 | 87 |
| 194 | තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 5775 | 5775 | 5643 | 98 |
| 196 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 3736 | 3736 | 3334 | 89 |
| 201 | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 65101 | 65101 | 62001 | 95 |
| 202 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 830 | 830 | 808 | 97 |
| 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 2322 | 2322 | 2283 | 98 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 4568 | 4568 | 4466 | 98 |
| 210 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 286 | 286 | 276 | 96 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 38847 | 38847 | 38298 | 99 |
| 217 | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 2518 | 2518 | 2253 | 89 |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 2920 | 2920 | 2820 | 97 |
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 16827 | 16827 | 16790 | 100 |
| 221 | කම්කරු දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 2324 | 2324 | 2324 | 100 |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 8003 | 8003 | 6768 | 85 |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 30999 | 30999 | 30901 | 100 |
| 237 | ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 216064 | 216064 | 204299 | 95 |
| 246 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 1099 | 1099 | 1099 | 100 |
| 247 | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 2002 | 2002 | 1667 | 83 |
| 248 | ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 4174 | 4174 | 3920 | 94 |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 130760 | 130760 | 126150 | 96 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් | 328039 | 328039 | 328039 | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 26783 | 26783 | 25883 | 97 |
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 1000 | 1000 | 993 | 99 |
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 990 | 990 | 957 | 97 |
| 292 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 2064 | 2064 | 2037 | 99 |
| 303 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 11510 | 11510 | 10969 | 95 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 5388 | 5388 | 4833 | 90 |
| 322 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 4000 | 4000 | 3953 | 99 |
| 326 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 833 | 833 | 719 | 86 |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 4135 | 4135 | 4116 | 100 |
| 328 | මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | පුනරාවර්තන හා ව්‍යාපෘති වියදම් | 2123 | 2123 | 2074 | 98 |
| | **එකතුව** | | **11,263,126** | **10,208,584** | **9,699,453** | |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000

| වත්කම් කේතය | අයිතම | 31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරිම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 2,083,656 | 2,083,656 | 47,000 | 100 |
| 9152 | යන්ත්‍රෝපකරණ | 795,532 | 795,532 | - | 100 |
| 9153 | ඉඩම් | 1,022,072 | 1,022,072 | - | 100 |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | |
| 9155 | ජීව විද්‍යාත්මකවත්කම් | - | - | - | |
| 9160 | කෙරීගෙන යන වැඩ | 4,303,555 | 4,303,555 | - | 100 |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | |

**3.9** විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. WPCG/GP/A/DS/FA/02/2025/39 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 මැයි 26 දින

ගණන්දීමේ නිලධාරී,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

යථෝක්ත වාර්තාව සහ පරීක්ෂා කරන ලද මූල්‍ය ප්‍රකාශන මේ සමඟ ඉදිරිපත් කරමි.

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එම්.ජී. මදරසිංහ

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්-රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 01

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. WPCG/GP/A/DS/FA/02/2025/39 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2026 මැයි 22 දින

ගණන්දීමේ නිලධාරී
ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහනෙහි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේදී වාර්තා කරන ලද දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථයකට 2024 ජූලි 18 දින සිදු වූ අනතුරට අදාළ අලාභයේ වටිනාකම වූ රු.100,629ක් හා පෙර වර්ෂවලට අදාළව කවදුරටත් කපා නොහල අලාභ ශේෂයන් 03ක එකතුව වූ රු.893,939ක් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (ii) හි ඇතුළත් කර නොතිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගම්පහ දිස්ත්‍රික් ලේකම් නමින් ලියාපදිංචිව ඇති රු.6,000,000 ක් වූ මෝටර් රථයක වටිනාකම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) බටේපොල සහ 298/ඒ නිල මහර - උතුර සේවා පියස් පිළිවෙලින් රු.9,200,000 ක් සහ රු.5,800,000 ක් ලෙස තක්සේරු කර තිබුණ ද, එම තක්සේරු වටිනාකම් මූල්‍ය නොවන වත්කම් වශයෙන් ගිණුම්ගත කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශනයෙහි සටහනක් මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙනත් ආයතන නමින් ලියාපදිංචි කර තිබූ නමුත් ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2006 වර්ෂය හා ඊට පසු වර්ෂවල සිට භාවිතා කරනු ලබන වාහන 03ක් දිස්ත්‍රික් ලේකම් නමින් පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. නමුත් හිමිකම නොමැති එම වාහනවල එකතු වටිනාකම වූ රු.15,200,000ක් මූල්‍ය නොවන වත්කම් වටිනාකම තුළට ඇතුළත් කර තිබුණි.

1.6.3 මූල්‍ය වත්කම්

සේවා ස්ථාන මාරුවීම්, මියයාම්, විශ්‍රාම යාම්, වැඩ තහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතූන් මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැනට සේවයෙහි නොමැති සේවකයන් 25 දෙනෙකුට අදාළව 2025 දෙසැම්බර් 31 දිනට අය විය යුතු ණය ශේෂය රු.3,832,759 ක් විය. ඉන් රු.912,134 කට අදාළ ණය ශේෂ 08ක්, වර්ෂ 3ක් හෝ ඊට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.7.1 (ඔ) | නිලසෙවන/සේවා පියස් කාර්යාල ගොඩනැගිලි, ඉඩම් තක්සේරුකර ගිණුම්ගත කළ යුතුය. | 1.6.2 (ආ) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

පුනරාවර්තන වැය විෂයයන් 32කට හා මූලධන වැය විෂයයන් 06කට අදාළව ලබාදී තිබුණු එකතුව රු.344,900,000ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.255,544,858ක් පමණක් උපයෝජනය කර තිබුණු හෙයින් ඉතිරිවීම් රු.89,355,142ක් වූ අතර එම ඉතිරිය සංශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රතිශතයන් ලෙස සියයට 07 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි.

### 3.2 සීමා ඉක්මවීම්

2025 අංක 03 දරන විසර්ජන පනත අනුව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විෂය අංක 25601 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ අවම ලැබීම් සීමාව රු.150,000,000 ක් වී තිබුණි. එහෙත් ගම්පහ දිස්ත්‍රික් ලේකම්ගේ අංක GAM/DIST/4/4/5 සහ 2025 ඔක්තෝබර් 23 දිනැති ලිපිය මගින් එම අවම ලැබීම් සීමාව රු.135,000,000 දක්වා සංශෝධනය සඳහා වූ ඉල්ලීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබුණද මෙම වාර්තාවේ දින වන විටත්, සීමා සංශෝධන නියෝගය අනුමත වී නොතිබුණි.

### 3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2025 දෙසැම්බර් 01 දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය, දිස්ත්‍රික් ලේකම් නිල නිවස, "අග්‍රා" ගොඩනැගිල්ල හා දිස්ත්‍රික් ලේකම් සම්බන්ධීකරණ කාර්යාලයේ පවිත්‍රතා කටයුතු සඳහා වැය විෂයය අංක 256-1-1-0-1405 යටතේ රු.1,170,735ක මුදලක් ලංකා බැංකුවේ අංක 231514 දරන චෙක්පත මගින් 2026 පෙබරවාරි 19 දින සී/ස රක්නා ආරක්ෂක ලංකා ආයතනය වෙත ගෙවා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය අනුව ඉහත වැය විෂයය සඳහා වූ බැරකම් රු.662,750ක් ලෙස දැක්වීම නිසා රු.507,985ක බැරකම් මූල්‍ය ප්‍රකාශනයේ අඩුවෙන් දක්වා තිබුණි.

### 3.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්‍රාම වැටුප් චක්‍රලේඛවලට අනුගත නොවීම සහ වෙනත් හේතූන් මත ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක 2025 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමිකයින් 164 දෙනෙකුට සිදුකරන ලද විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් රු.20,824,982ක් විය.

(ආ) 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2019 මැයි 30 දිනැති අංක 02/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව තම කොට්ඨාශයේ යම් විශ්‍රාමිකයෙකු මියගිය පසු දින 07ක් ඇතුළත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැනුම් දීම ග්‍රාම නිලධාරියකු විසින් සිදුකළ යුතු අතර මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන්ගෙන් "බී" 73 දරන වාර්තාවට අදාළ තොරතුරු ලබාගෙන තම කාර්යාලයට අදාළ විශ්‍රාම වැටුප්

ලබන්නන්ගේ ලේඛනය යාවත්කාලීන කර ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන් නොපමාව ක්‍රියාකළ යුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් විශ්‍රාමිකයා මියගිය පසුවත් ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සිදුවන අවස්ථාවන් පැවතුණි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක විශ්‍රාමිකයින් 179 දෙනෙකුගේ මියයාම ප්‍රමාද වී දැනුම් දීම හේතුවෙන් සිදු කර තිබූ වැඩිපුර ගෙවීම්වලින් 2025 දෙසැම්බර් 31 දිනට තවදුරටත් රු.14.609.019 ක් අයකර ගත යුතුව පැවතුණි.

(ඈ) "දිට්වා" සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ගම්පහ දිස්ත්‍රික්කයේ පවුල් සංඛ්‍යාව 89,439 ක්ද, පුද්ගලයින් සංඛ්‍යාව 346,093ක් ද විය. සිදු වූ ජීවිත හානි සංඛ්‍යාව 17ක් වන අතර අතුරුදහන් වූ සංඛ්‍යාව 01 ක් විය. නිවාස 256 ක් පූර්ණ හානියට පත් වූ අතර අර්ධ නිවාස හානි 10,067ක් වාර්තා වී තිබූ අතර සුළි කුණාටු තත්ත්වයෙන් ව්‍යාපාරික ස්ථාන 6,046කට හානි සිදු වී තිබුණි. එලෙස සුළි කුණාටු තත්ත්වයට මැදිහත් වූ ජනතාව නඟා සිටුවීම සඳහා රජය මඟින් ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2026 මාර්තු 26 දින වන විට රු.8,330,910,854ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර. එයින් රු.5,602,470,068ක් පහත සඳහන් පරිදි උපයෝජනය කර තිබුණි.

(i) 2026 මාර්තු 25 දින වන විට රු.25,000ක නිවාස පිරිසිදු කිරීමේ දීමනාව, නිවාස ඒකක 76,141ක් සඳහා රු.1,903,525,000ක් හා රු.50,000ක දීමනාව නිවාස ඒකක 32,812කට අදාළව රු.1,640,600,000ක් ගෙවීම් කර තිබූ අතර තවදුරටත් ගෙවිය යුතු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ජනාධිපති අරමුදලින් ලබාදෙන රු.10,000ක සිසු දීමනාව සිසුන් 38,565කට අදාළව රු.385,650,000ක් ගෙවීම්කර ඇති අතර තවදුරටත් සිසුන් 1905ක් සඳහා රු.19,050,000ක් ගෙවීමට නියමිතව තිබුණි. රු.15,000ක දීමනාව සිසුන් 40,200ක් සඳහා රු.603,000,000ක් ගෙවීම්කර තිබූ අතර තවදුරටත් ගෙවිය යුතු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ව්‍යාපාර හානි වන්දි රු.25,000, රු.50,000ක්, හා රු.200,000ක් වශයෙන් ව්‍යාපාර 2,486ක් සඳහා රු.263,550,000ක් ගෙවා තිබුණි. කර්මාන්ත අමාත්‍යාංශය විසින් ව්‍යාපාර හානි සඳහා ලබා දෙන රු.200,000ක වන්දි මුදල වෙනුවෙන් රු.99,600,000ක් ගෙවීම්කර තිබූ අතර තව දුරටත් ගෙවිය යුතු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(iv) නිවාස කුලී දීමනාව ලෙස 2025 දෙසැම්බර් සිට 2026 පෙබරවාරි දක්වා රු.7,850,000ක් ගෙවා තිබූ අතර තව දුරටත් ගෙවිය යුතු මුදල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(v) තවද ජීවනෝපාය අහිමිවීමේ දීමනාව ලෙස රු.25,000ක් හා රු.50,000ක් වශයෙන් රු.5,050,000ක් ගෙවීම්කර තිබූ අතර තවදුරටත් පුද්ගලයන් 25 දෙනෙකුට රු.2,575,000ක් මුදලක් ගෙවිය යුතු ව පැවතුණි.

(vi) ආපදාව හේතුවෙන් සිදු වූ ජීවිත හානි 16 කට අදාළව රු.17,600,000ක් ගෙවීම් කර තිබුණි.

(vii) ආපදා තත්වය හේතුවෙන් සිදු වූ නිවාස හානි හේතුවෙන් අර්ධහානි සඳහා නිවාස ඒකක 723ක් සඳහා රු.62,673,699ක් ගෙවීම් කර තිබූ අතර පූර්ණ නිවාස හානි හේතුවෙන් නිවාස ඒකක 10කට අදාළව රු.20,000,000ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා වෙන් කර දී තිබුණි.

(viii) මීට අමතරව ගම්පහ දිස්ත්‍රික්කයේ සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූවන්ට පිසූ ආහාර ලබා දීම සඳහා රු.100,026,314ක් ද, වියළිසලාක සඳහා රු.513,165,055ක් ද

කඩිනමින් සහන සැපයීම් සඳහා රු.180,000ක් ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ගෙවීම් කර තිබුණි.

(ඈ) දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පැන නැගුණු හදිසි ආපදා තත්ත්වයේ බලපෑමට ලක් වූ ජනතාව උදෙසා පිසූ ආහාර සැපයීමට අදාළව සිදු කරන ලද වියදම් ප්‍රතිපූර්ණය ආපදා තත්ත්වය පහව යාමෙන් පසු සිදු කර තිබුණද, එම ගෙවීම්වලට අදාළව පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරීන් විසින් පිසූ අහාරවලට අදාළව ගෙවීම් සිදු කළ බව දක්වා රු.1,490,390 ක මුදලක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණු නමුත් ග්‍රාම නිලධාරී විසින් අදාළ සැපයුම්කරු වෙත ගෙවීම් සිදු කළ බවට තහවුරුවක් නොතිබුණි. එමෙන්ම 2025 ජනවාරි 21 දිනැති අංක 01/2025 දරන ආපදා සහන සේවා මාර්ගෝපදේශයේ 5.1.5.2 යටතේ පිසූ ආහාර ලබාදීමේදී ඒවා ලබාගත් ප්‍රතිලාභින්ගේ අත්සන් ලේඛනයක් ලබා ගෙන ප්‍රාදේශීය ලේකම්ගේ හා දිස්ත්‍රික් ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව සමග ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණ ද, අංක 325/B දාරළුව හා පිටියේගෙදර ග්‍රාම නිලධාරී වසම්වල ප්‍රතිලාභීන් විසින් මාර්ගෝපදේශය ප්‍රකාරව අත්සන් කර නොතිබුණි.

(ii) ආපදා තත්ත්වය පහව යාමෙන් පසු බලපෑමට ලක් වූ පුද්ගලයන්ට වියළි සලාක සඳහා කූපන්පත් ලබා දී තිබුණද, කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් කූපන්පත්වල තොරතුරු ඇතුළත් කරමින් විධිමත් ලේඛනයක් පවත්වාගෙන නොමැති අතර, ග්‍රාම නිලධාරී අත්සන හා නිලමුද්‍රාව මත පමණක් කූපන්පත් නිකුත් කර තිබූ අතර අනුක්‍රමික අංකයක් සටහන් කිරීමට කටයුතුකර නොතිබුණි.

(iii) දිට්වා ආපදා තත්ත්වය හේතුවෙන් කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව කොටුගොඩ ග්‍රාම නිලධාරී වසම තුළ ආපදා සිද්ධි වාර්තාවට අනුව පවුල් 788ක පුද්ගලයින් 3127ක් බලපෑමට ලක් වී තිබුණි. මෙහිදී 2025 නොවැම්බර් 29 සිට දෙසැම්බර් 03 දින දක්වා පුද්ගලයින් 1300 – 1500 අතර සංඛ්‍යාවකට ආහාර වේල් 13ක් සැපයීමට අදාළව එක් ආයතනයකට කෑම පාර්සල් 7,200 ක් සඳහා රු.1,620,000ක් 2025 දෙසැම්බර් 30 දින ගෙවා තිබූ අතර Saman Caters ආයතනයෙන් කෑම පාර්සල් 11,400 ක් ලබාගැනීම වෙනුවෙන් ගෙවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම සඳහා වසමේ ග්‍රාම නිලධාරීහට රු. 2,137,500 ක මුදලක්ද 2025 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. නමුත් ග්‍රාම නිලධාරී විසින් අදාළ සැපයුම්කාර ආයතනය වෙත 2025 දෙසැම්බර් 31 දිනට පෙර මුදල් ගෙවූ බවට පිළිගතහැකි ලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. තවද මෙම ගෙවීමට අදාළව සැපයූ පිසූ ආහාර වේල් ගණන සම්බන්ධයෙන් 2026 පෙබරවාරි 11 දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී තහවුරු කර ගත් තොරතුරු අනුව එක් ආහාර වේලක්වත් ලබා නොගත් පුද්ගලයන් හා ආහාර වේල් 13ට අඩුවෙන් ලබාගත් ප්‍රතිලාභීන් ඇති බව නිරීක්ෂණය වූ අතර එම ප්‍රතිලාභීන්ට අදාළව ගෙවීම් කිරීමට ඉදිරිපත් කර තිබූ, අත්සන් ලේඛනය පරීක්ෂාකිරීමේදී එම ප්‍රතිලාභීන් ආහාර වේල් 13 ක් ලබා ගත් බව සඳහන් කර තිබීම විගණනයේදී පිළිගත නොහැකි කරුණක් විය.

## 3.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි

පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන | |
| (i) XXIV පරිච්ඡේදයේ 4 ඡේදය | 2025 දෙසැම්බර් 31 දිනට මියගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,633,399 ක් වූ ණය ශේෂ සහ නිලධාරියා විශ්‍රාම ගොස් මාස 03 කට වැඩි කාලසීමාවක් ගත වී තිබුණ ද අය කර නොගත් එකතුව රු.1,300,785ක්වූ ණය ශේෂ 10 ක් 2026 මාර්තු 30 දින වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි. |
| (ii) XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 | 2012 වර්ෂයේදී වැඩතහනමට ලක් වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් තවදුරටත් අයවිය යුතු එකතුව රු.67,653ක් වූ ණය ශේෂ දෙකක් වසර 13කට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවතුණි. |
| (ආ) 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් සේවය අතහැර ගොස් තිබූ නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.830,922ක්වූ ණය ශේෂ 2026 මාර්තු 30 දින වන විටත් අයකරගෙන නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු බව දන්වා ඇතත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචිත වාහන 11කට අදාළව එසේ ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඈ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජ්‍ය සේවය තුළ කේන්ද්‍ර වී පවත්නා මානව සම්පත රටේ සංවර්ධනය සඳහා වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස |

යොදා ගැනීම සිඹිය රාජ්‍ය ආයතනයන්හි සේවය කරන සෑම වර්ගයකම රාජ්‍ය සේවකයින්ගේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු වුවද, දොම්පෙ සහ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2025 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 3.7 අවිධිමත් ගනුදෙනු

මු.රෙ.137 අනුව ගෙවීම අනුමත කිරීම සේවාවන්, වැඩ හෝ සැපයුම සම්පූර්ණ කෙරුණ විට කළ යුතු බවත් මු.රෙ.237 අනුව ගෙවීම් වවුචරයක් සහතික කිරීමේදී වැඩ හෝ සැපයුම් ගිවිසුම් ප්‍රකාරව නිම කර ඇති බවටද, භාණ්ඩ භාර ලැබී ඇති බවටද අදාළ බඩු ලේඛනයන්හි තොග පොත යනාදියෙහි එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවටද සහතික ඇමිණිය යුතු බව සඳහන්ව පැවතියද, බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව 2025 දෙසැම්බර් 31 දින වන විටත් මැටි කර්මාන්තයට අදාළ යන්ත්‍ර ලැබී නොතිබියදීත් එම යන්ත්‍ර වෙනුවෙන් රු.11,385,000ක ගෙවීම් වවුචර පිළියෙල කර ගෙවීම් කළ බවට අදාළ වැය ගිණුම්වල ගිණුම්ගත කර තිබුණු අතර අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව ව්‍යාපෘති වැඩ කටයුතු අවසන්ව නොතිබියදීත් රු.36,842,901ක වටිනාකමින් යුත් චෙක්පත් 2ක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නමට ගෙවීම් කළ බවට අදාළ වැය ගිණුම්වලට ගිණුම්ගත කර තිබුණි.

## 3.8 තැන්පතු

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොදු තැන්පත් ගිණුම් 06කට අදාළව රු.913,733,286ක එකතු ශේෂයක් පැවති අතර ඒ අතුරින් ඉඩම් තැන්පතු හැර පොදු තැන්පත් ගිණුම් 04කට අදාළව වසර දෙකක් ඉක්මවූ නිරවුල් කර නොතිබූ එකතුව රු.49,370,804ක්වූ තැන්පතු ශේෂ 45ක් පැවතුණි. එසේම එකී ශේෂය තුළ පොදු තැන්පතු ගිණුම් 02කට අදාළව රු.4,459,543ක් වූ වසර 5ක් ඉක්ම වූ තැන්පතු ද පැවති අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (3) විධිවිධාන ප්‍රකාරව පවතින අඩුපාඩු හා දෝෂ නිවැරදිකර අදාළ පාර්ශව වෙත තැන්පත් මුදල් ගෙවා දැමීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ විධිමත් පියවර ගෙන නොතිබුණි.

## 3.9 බැංකු ගිණුම් මෙහෙයවීම

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව 2025 දෙසැම්බර් 31 දිනට, නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් ශේෂය රු.2,804,035,886 ක් වූ අතර ඉන් මාස 6ට වැඩි නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ ශේෂය රු.507,017ක් විය. එමෙන්ම එදිනට තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් වටිනාකම රු.183,914,211ක් වන අතර ඉන් මාස 3 ට වැඩි චෙක්පත් වටිනාකම රු4,197,000ක් විය.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලැසුම් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර තිබුණ ද ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්/ගණන් දීමේ නිලධාරී වෙත ඉදිරිපත්කර අනුමත කරගෙන නොතිබුණි. ඉදිරිපත්කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඇතැම්

අංශවල ක්‍රියාකාරීත්වය ඇගයීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන කාර්යසාධන දර්ශක කිසිවක් ඉදිරිපත්කර නොතිබුණු අතරම ක්‍රියාකාරී සැලැස්මේ ඉදිරිපත්කර තිබුණු ඇතැම් අංශවල අපේක්ෂිත ඒකකය, වගකීම් ක්ෂේත්‍රයන්, භෞතික මූල්‍ය ඉලක්ක, ප්‍රතිදානය, ප්‍රතිඵලය සහ වගකිවයුතු නිලධාරීන් යනාදී තොරතුරු සඳහන් කර නොතිබුණි.

### 4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ "සුවපහසු මූලාධාර" වැඩසටහන යටතේ වැඩිහිටියන්ට තම නිවස තුළ ජීවත්වීම සඳහා අවම පහසුකම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීම වෙනුවෙන් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැඩිහිටි පුද්ගලයින් දස දෙනෙකුට මුදල් ආධාර ලබා දීම සඳහා රු.1,000,000ක මුදලක් 2024 ඔක්තෝබර් 28 දිනැති ලංකා බැංකුවේ අංක 181643 දරන චෙක්පත මඟින් ලබා දී තිබුණි. ගම්පහ ප්‍රාදේශීය ලේකම් ඇමතූ වැඩිහිටි මහලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරීගේ ලිපිය අනුව ආධාර හිමි වැඩිහිටියන් වෙත මුදල් ලබා දීම සම්බන්ධ වාර්තාව 2024 දෙසැම්බර් 15 දිනට පෙර ලැබීමට සලස්වන මෙන් දන්වා තිබුණ ද ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර ලැබුණු ඉහත මුදල 2024 නොවැම්බර් 12 දින අංක 6000-0-0-13-049 දරන තෙවන පාර්ශවීය තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. 2026 අප්‍රේල් වන විටත් මෙම ව්‍යාපෘතිය අවසන් වී නොතිබුණු අතර ප්‍රතිලාභීන් 10 දෙනෙකු සඳහා එක් අයෙකුට රු.100,000 බැගින් වන සේ වැසිකිළි පහසුකම් සකස්කර දීම වෙනුවෙන්, ඇඹිරළුව දකුණ, උදාර වැඩිහිටි සමිතිය සමඟ 2025 දෙසැම්බර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව වැඩ අවසන් කළ යුතු දිනය 2025 දෙසැම්බර් 31 දින වුවත් 2026 අප්‍රේල් වන විටත් මෙම ව්‍යාපෘතියට මුදල් ලැබී මාස 16කටත් වඩා වැඩි කාලයක් ගත වී ඇතත් අවසන් නොවුණ මෙම ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත ප්‍රතිඵලය වූ "වැඩිහිටියන් තම නිවස තුළ ජීවත් වීම සඳහා අවම පහසුකම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීම" යන්න මෙම වාර්තාව නිකුත් කරන දින වන විටත් ඉටු වී නොතිබුණි.

### 4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ වැබොඩමුල්ල මැටි නිෂ්පාදන ගම්මාන ප්‍රතිලාභීන් වෙනුවෙන් විසිතුරු භාණ්ඩ පිළිස්සීම සඳහා ඒකක මිල රු.1,296,000ක් වූ විදුලි උදුන් 02ක් රු.2,592,000ක මුදලකට මිලදී ගෙන තිබුණද, මෙම විදුලි උදුන් ක්‍රියාකරවීම සඳහා විශාල විදුලි ඒකක සංඛ්‍යාවක් වැය වීම හේතුවෙන් වසර 04කට වැඩිකාලයක් තිස්සේ එම උදුන් භාවිතයට ගෙන නොමැති බැවින් අදාළ වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

### 4.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ, ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ, හොරපේ ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයට අනුබද්ධව ප්‍රජා මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වැය විෂයය අංක 147-02-04-02-2201 යටතේ 2017 හා 2018 වර්ෂවලදී රු.4,853,173ක වියදමක් වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණි. මෙම ගොඩනැගිල්ල ඉදිකර වසර 07කට වැඩි කාලයක් ගතවී ඇතත් 2026 මැයි වන විටත් මෙම ගොඩනැගිල්ල අදාළ කාර්ය සඳහා භාවිතා නොකරන බැවින් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කරන ලද රු.4,853,173ක මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව ආරම්භකර තිබූ මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අවශ්‍යතා විශ්ලේෂණයක් සිදුකර ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කළ බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එමෙන්ම ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළ භූමිය, වත්තල ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය සතු වූ බැවින් අවහිරයකින් තොරව ප්‍රජා කටයුතු වෙනුවෙන් යොදා ගැනීමට ඇති හැකියාව තහවුරුකර ගනිමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට

කටයුතු කරන මෙන් දන්වා තිබුණද, එසේ කටයුතු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාබෝදල කොට්ඨාසය තුළ ග්‍රාම නිලධාරී වසම් 06 ක ග්‍රාමීය ප්‍රජාවට තම නිෂ්පාදන පහසුවෙන් අලෙවි කිරීම සහ, අතරමැදියන්ගෙන් තොරව සාධාරණ මිලක් ලබාගැනීම සඳහා පොදු නිෂ්පාදන අලෙවි කිරීමේ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතිය වෙනුවෙන් 2022 වර්ෂයේදී රු.4,060,328 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ව්‍යාපෘතිය අවසන්ව වසර 03ක් පමණ ගතවී ඇතත් අදාළ ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ගම්පහ මාකෙවිට සෞභාග්‍යා විසිතුරු පැළ නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ ගම්පහ ප්‍රාදේශීය ලේකම්ට නීත්‍යානුකූල අයිතියක් නොමැති ඉඩමක ගත්‍යතා අධ්‍යනයකින් තොරව, වෙළඳ කුටි හයක් ඉදිකිරීම සඳහා රු.3,018,576 ක් සහ ඊට අදාළව යටිතල පහසුකම් සැපයීම සඳහා රු.1,439,749 ක් වශයෙන් එකතුව රු.4,458,325ක් වැය කර තිබුණි. තවද ගොඩනැගිල්ලේ වැඩ අවසන් නොවීම හේතුවෙන් රු.245,000 ක් වැයකර 2021 වර්ෂයේ මිලදී ගෙන තිබුණු විදුලි පොල්ලෙලි කපන මැෂිම 2022 මාර්තු සිට සෞභාග්‍යා විසිතුරු පැළ නිෂ්පාදන සමිතියේ සාමාජිකාවකගේ නිවසේ සවිකර තිබුණි.

### 4.1.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මණ්ඩාවල උතුර සේවා පියස සහිත බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත වියදම රු.900,00ක් වූ අතර මෙම ගොඩනැගිල්ල වෙන්දේසි කරන ලද ඉඩමක ප්‍රාදේශීය සභාව වෙත වෙන් කර තිබූ අවසාන ඉඩම් කට්ටියේ ඉදිකර තිබුණි. අදාළ ගොඩනැගිල්ලේ කාමර 04ක් වහල මට්ටම දක්වා ඉදිකිරීම සහ සමිති ශාලාවේ භාග බිත්ති ඉදිකිරීම වෙනුවෙන් රු.873,000ක වියදමක් දරා තිබුණි. මෙම ව්‍යාපෘතිය අතරමග නතරකර වසර 4 ක් පමණ ගතවී තිබුණද විගණන නිරීක්ෂිත අවස්ථාව වන 2025 ඔක්තෝබර් 14දින වන විට ව්‍යාපෘති භූමිය මෙන්ම ඒවෙත පිවිසෙන මාර්ගයද වල් බිහි වී ගමන් කිරීමටද ඉතාමත් අපහසු තත්ත්වයක පැවතුණි.

(ආ) දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් දැනැමුල්ල ග්‍රාම නිලධාරී වසමේ ප්‍රජාශාලා භූමියේ ඉතිරි කොටසේ රාජ්‍ය නිලධාරීන් සඳහා සේවා පියසක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2022 මාර්තු 02 දින ආරම්භ කර තිබූ අතර රු.419,915ක වියදමක් දරා ගොඩනැගිල්ලේ බිත්ති වහල මට්ටම දක්වා පමණක් ඉදිකිරීම සිදුකර තිබූ ව්‍යාපෘතිය අතරමඟ නතරකර වසර 4ක් පමණ ගතවී තිබුණි.

(ඇ) දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මදුරාව ග්‍රාම නිලධාරී වසමේ මහගෙදර වත්ත වෙන්දේසි ඉඩමේ සේවා පියසක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2022 මාර්තු 31 දින ආරම්භ කර රු.481,560ක වියදමක් දරා තිබුණි. ගොඩනැගිල්ලේ බිත්ති වහල මට්ටම දක්වා පමණක් ඉදිකිරීම සිදුකර තිබූ මෙම ව්‍යාපෘතිය අතරමඟ නතරකර වසර 4ක් පමණ ගතවී තිබුණි.

(ඈ) දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් පාලුපැල්පිට බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2022 මාර්තු 24 දින ආරම්භ කර තිබූ අතර රු.506,914ක වියදමක් දරා ගොඩනැගිල්ලේ අත්තිවාරම පමණක් ඉදිකර ව්‍යාපෘතියේ ඉදිකිරීම් අතරමඟ නතරකර මේ වන විට වසර 04ක් පමණ ගතවී තිබුණි.

(ඉ) 2021 වර්ෂයේ "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන මගින් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ 309 කිරිකිත්තමුල්ල ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී සහ සංවර්ධන නිලධාරී කාර්යාල ලෙස භාවිතා කළ ගොඩනැගිල්ල කඩා ඉවත් කර එම ස්ථානයේ බහු

කාර්යය ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රු.409,608ක් වැයකර තිබුණද, එම ගොඩනැගිල්ල භාවිත තත්ත්වයට සම්පූර්ණ කර නොමැතිව මෙම ව්‍යාපෘතිය අතරමග නතරකර වසර 4ක් පමණ ගතවී තිබුණි.

### 4.1.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද, විගණනයට ඉදිරිපත් කරන ලද්දේ දින 52 කාල ප්‍රමාදයකින් පසුව 2026 අප්‍රේල් 22 දිනදීය.

## 4.2 ප්‍රසම්පාදනයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයට ආපන ශාලා කටයුතු සැපයීම සඳහා 2024/2025 (2024 සැප්තැම්බර් 03 සිට 2025 සැප්තැම්බර් 02 දක්වා) හා 2025/2026 (2025 සැප්තැම්බර් 03 සිට 2026 සැප්තැම්බර් 03 දක්වා) වර්ෂයන්ට අදාළව ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.19 ඡේදය අනුව ගිවිසුම්ගත වීමට ප්‍රථම, කොන්ත්‍රාත්කරු විසින් කාර්යසාධන සුරක්ෂණයක් ලබා දිය යුතු වුවත් 2025/2026 වර්ෂයට අදාළව කොන්ත්‍රාත්කරු දින 76 ක කාල ප්‍රමාදයන් සහිතව කාර්යසාධන සුරක්ෂණය ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.5 ඡේදය අනුව ප්‍රසම්පාදන ආචාරධර්මයන්ට අනුකූලවන අයුරින් ලංසුකරුවන් කටයුතු කළ යුතු අතර ලංසුකරු විසින් දූෂසන්ධානීය නොවන බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වුවද 2025/2026 කාලය සඳහා ප්‍රසම්පාදනයේදී ලංසු ඉදිරිපත් කර තිබූ ආයතන දෙකෙහි හිමිකරුවන්ගේ තොරතුරු පරීක්ෂා කිරීමේදී හිමිකරුවන් දෙදෙනා එකම ලිපිනයේ පදිංචිකරුවන් බව නිරීක්ෂණය විය. තවද මෙම ප්‍රසම්පාදනයේදී ලංසු ඉදිරිපත් කර තිබූ ලංසුකරුවෙකු අනෙක් ආයතනයේ ලංසු ලේඛන තුළ ඇතුළත් ලංසු සුරක්ෂණ ප්‍රකාශනයෙහි සාක්ෂිකරුවන් ලෙස අත්සන් කර තිබුණි.

## 4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගම්පහ දිස්ත්‍රික් ලේකම් නමින් ලියාපදිංචි කර තිබූ නමුත් වෙනත් ආයතන විසින් භාවිතා කරනු ලබන කැබ් රථ 03ක් හා බස් රථයක් වෙනත් ආයතන වෙත ලබා දී වසර 13 සිට වසර 26 ක කාල පරාසයක් ගතව තිබුණද එම වාහන අදාළ ආයතන වෙත පවරා දීමට කටයුතු කර නොතිබුණි. නමුත් ඉන් එක් වාහනයක වටිනාකම වූ රු.1,700,000ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය මූල්‍ය නොවන වත්කම් වටිනාකම් තුළ ඇතුළත්ව තිබුණි. 2025 දෙසැම්බර් 31 දින වන විටත් එම වාහනය අදාළ ආයතනය වෙත පවරා දී ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මිනුවන්ගොඩ සහ දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව පිළිවෙලින් සේවා පියස් 02ක් සහ 12ක් පෞද්ගලික පරිත්‍යාග ඉඩම්වල ඉදිකර තිබූ නමුත් මෙම ඉඩම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5කට අදාළව නිල නිවාස අතරින් ගොඩනැගිලි වටිනාකම රු.19,022,938ක් වූ නිල නිවාස 09 ක් වසර 01 සිට 13 දක්වා කාල පරාසයක සිට භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

(ඈ) මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩම ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට පැවරීමට මීනුවන්ගොඩ නගර සභාව 2022 ජුලි 04 දින පූර්ණ එකඟතාවය ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉඩම පවරා ගෙන නොතිබුණි.

(ඉ) මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව අයිතිය ප්‍රාදේශීය ලේකම් සතු නිල සෙවන කාර්යාල පිහිටි, ඉඩම් කොටස් 17ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

4.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2022 ඔක්තෝබර් 06 දින රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව දුරකථන රැහැන් කණුවක හා කොන්ක්‍රීට් කණුවක ගැටීමෙන් සිදුවූ අනතුරට අදාළව අළුත්වැඩියා වියදම රු.3,957,450ක් වුවත් රක්ෂණය මඟින් ලබාදුන් මුදල රු.3,472,865ක් පමණක් වූයෙන්, තවදුරටත් පැවති රු484,585ක නොපියවූ අලාභය සමාලෝචිත වර්ෂය අවසානයටත් අයකරගෙන නොතිබුණි.

(ආ) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 ජුලි 15 දින සිදු වූ සේප්පුවේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (1) (ආ) ප්‍රකාරව පැවති අවසන් පරීක්ෂණ වාර්තාව අනුව ප්‍රාදේශීය ලේකම්, ගණකාධිකාරී, මුදල් සහකාර සහ සරප් යන නිලධාරීන්ගෙන් සමානව රු.270,561ක් බැගින් අයකර ගත යුතු බවට නිර්දේශ කර තිබූ අතර 2020 සැප්තැම්බර් 22 දිනැති ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් අදාළ අය කිරීම සඳහා නිර්දේශ හා අනුමැතිය ද 2023 නොවැම්බර් 23 දිනැති රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අලාභය අයකරගැනීමේ නියෝගය පරිදි 2023 දෙසැම්බර් 31 දිනට පෙර රජයට සිදුවී ඇති අලාභය වන රු.1,082,245ක මුදල හා අලාභයෙන් සියයට 25ක් වූ දෙපාර්තමේන්තු ගාස්තුව වංචාවට වගකිවයුතු පාර්ශවයන්ගෙන් සමසේ අයකර ගතයුතු බවට නියෝගකර තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් අදාළ මුදල ගණකාධිකාරී පමණක් ගෙවා අවසන් කර තිබුණු අතර අදාළ සියළු වගකිව යුත්තන් මේ දක්වා ගෙවා තිබූ මුදල රු.711,162 ක් පමණක් විය.

(ඇ) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබාගත් අයෙකුගේ විශ්‍රාම වැටුප හා ඇයට හිමි වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප එම විශ්‍රාමිකයා මිය යාමෙන් පසුවද වසර 05 ක් පමණ කාලයක් සඳහා රු.2,696,304ක් ගෙවා තිබුණි. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 09/2014 අනුව ජීවිත සහතික ලබා නොදෙන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් තාවකාලිකව නතර කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් විශ්‍රාම ප්‍රතිලාභියා විසින් ජීවත් වීමේ සහතික ලබා දී නොතිබිය දී 2013 සිට 2016 දක්වා වූ වසරවලදී විශ්‍රාම වැටුප් අවිධිමත් ලෙස ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ඉහත මුදලින් රු.2,388,251ක් තවදුරටත් අයවීමට පැවතුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 325බී දාරළුව වසමේ ග්‍රාම නිලධාරී සහ සංවර්ධන නිලධාරී කාර්යාලය පවත්වාගෙන යනු ලබන ප්‍රජාශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සංවර්ධන වැඩසටහන් කිහිපයක් යටතේ 2015 වර්ෂයේදී රු.979,723ක්, 2016 වර්ෂයේදී රු.499,440ක් සහ 2021 වර්ෂයේදී රු.338,916ක් වශයෙන් රු.1,818,079ක් වියදම්

සිදුකර පෞද්ගලික පරිත්‍යාග ඉඩමක ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණද වසර 10කට වැඩි කාලයක් ගතවී තිබුණු එකී ඉඩම පවරාගැනීම මේ දක්වා සිදුකර නොතිබුණි.

(ආ) 1916 අංක 33 දරන තුවක්කු ආඥා පනතේ 05(1) හා 23(3) වගන්තිවල විධිවිධාන ප්‍රකාරව 2025 වර්ෂය සඳහා තුවක්කු බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය විධිවිධාන හා උපදෙස් ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2024 අගෝස්තු 08 දිනැති අංක 01/2024 චක්‍රලේඛය මගින් ලබාදී තිබුණි. නමුත් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2025 සැප්තැම්බර් 30 දින වන විටත් බලපත්‍ර අලුත් කර නොමැති ගිනිඅවි 665කට අදාළව හිඟ ගිනි අවි බලපත්‍ර ගාස්තු වටිනාකම රු.82,800 ක් පැවතුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 කට අදාළව නිකුත් කර ඇති ගිනි අවි බලපත්‍ර ගණන 2,061කි. ඉන් 2025 වර්ෂය සඳහා බලපත්‍රය අලුත් නොකළ, ගිනිඅවි 385කට අදාළව අවසන්වරට බලපත්‍ර ලබාගත් වර්ෂය දක්වා නොතිබුණි. එමෙන්ම අවසන්වරට බලපත්‍ර ලබාගත් වර්ෂය දක්වා ඇති ගිනිඅවි 292කට අදාළව ඉදිරිපත් කරන ලද විස්තර අනුව අවුරුදු 01 සිට අවුරුදු 10 දක්වා කාල පරාසයක සිට ගිනි අවි බලපත්‍ර අළුත් කර නොතිබුණි. තවද, ගිනිඅවි හිමිකරුවන් මියගොස් ඇති අවස්ථාවන් සහ ගිනිඅවි හිමිකරුවන් සම්බන්ධව ග්‍රාම නිලධාරී විසින් පුද්ගලයෙකු නොමැති බව හා පුද්ගලයා සොයාගත නොහැකි බව දක්වා තිබූ අවස්ථාවන් පැවතුණත් එම තොරතුරු අනුව දත්ත පද්ධතිය නිවැරදි කිරීම සිදු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් විශ්‍රාම වැටුප් ගෙවීම කරනු ලබන සෑම පුද්ගලයෙකු වෙනුවෙන්ම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වා ගත යුතු වුවත්, මීගමුව, මිනුවන්ගොඩ, දොම්පෙ, සහ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයින් පිළිවෙලින් 13ක්, 17ක්, 07ක්, සහ 05 දෙනෙකු වෙනුවෙන් තාවකාලික ලිපිගොනු සකස් කර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයටත් අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) 2025 ජූලි 03 දිනැති මීගමුව මහ නගර සභාවේ නාගරික ගණකාධිකාරී විසින් යොමුකරන ලද ලිපිය අනුව 2024 දෙසැම්බර් 31 දිනට මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වරිපනම් අංක 04 ක දේපළ සඳහා 2005 සිට 2020 වර්ෂය අතර කාල සීමාවකට අදාළව රු.388,553ක හිඟ වරිපනම් පැවතුණද සමාලෝචිත වර්ෂය අවසානයටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කළ ග්‍රාම නිලධාරීන් දෙදෙනකු ණය ශේෂ පියවීමකින් තොරව 2016 සහ 2018 වර්ෂවලදී සේවය හැර යාමේ සිද්ධීන් දෙකක් පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාවේ දී අනාවරණය වූ අතර එම නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු යතුරුපැදි ණය ශේෂ එකතුව රු.289,840ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකරගෙන නොතිබුණි.

(ඊ) ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරීගේ 2025 ඔක්තෝබර් 17 දිනැති ඉඩම් හා ගොඩනැගිලි තක්සේරුව පිළිබඳව තොරතුරු කැඳවීමේ ලිපියේ තොරතුරු වලට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට සේවා පියස් හා නිල නිවාසවලට අදාළව ඉඩම් කොටස් 135ක්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාළව ගොඩනැගිලි 48ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තක්සේරු කරවා ගැනීමට නොහැකි වී තිබුණි.

(උ) අක්‍රීය ග්‍රාම ශක්ති සමිති මගින් එම සමිති සතු රජයේ අරමුදල් සහ පොළිය දිස්ත්‍රික් ලේකම්ගේ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කිරීම මගින් ඌන උපයෝජිත තත්ත්වයේ පවතින රජයේ අරමුදල් සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය විසින් උපදෙස් ලබාදී තිබුණි. ඒ අනුව එම අක්‍රීය සමිතිවල පවතින සියළු රජයේ අරමුදල් 2025 දෙසැම්බර් 31 දින හෝ එදිනට පෙර දිස්ත්‍රික් ලේකම්ගේ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය. ගම්පහ දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13හි අක්‍රීය ග්‍රාම ශක්ති සමිති 133කට අදාළව 2025 දෙසැම්බර්

31 දිනට වූ අරමුදල් ශේෂය රු.57,813,375ක් වූ අතර එයින් සමිති 10කට අදාළව රු.10,929,702ක් 2026 අප්‍රේල් 20 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

5. තිරසර සංවර්ධනය

2025 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය යටතේ තිරසර සංවර්ධන අරමුණු 11 ක් යටතේ දර්ශක 24ක ප්‍රගතිය දක්වා තිබුණු අතර එයින් දර්ශක 15ක ප්‍රගතිය සියයට 50කට වඩා පහල අගයක්ද දර්ශක 04ක ප්‍රගතිය සියයට 50 – 74 අතර අගයකද පැවතුණි.

6 මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපත් කළ තොරතුරු අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා 2025 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 3459ක් සහ තත්‍ය කාර්ය මණ්ඩලය 3142ක් වූ අතර තනතුරු කාණ්ඩ 04කට අදාළව පුරප්පාඩු 366ක් සහ තනතුරු කාණ්ඩ 03කට අදාළව 49 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

(ආ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වසර 5ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් තනතුරුවල / සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා වහාම ස්ථානමාරු ලබාදිය යුතු වුව ද, ඊට අනුකූල නොවී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6ක නිලධාරීන් 494 දෙනෙකු වසර 5කට වැඩි කාලයක් එම කාර්යාලයේම සේවය කර තිබූ අතර, ඉන් නිලධාරීන් 378 දෙනෙකු වසර 10 කට වැඩි කාලයක් එම කාර්යාලයේම සේවය කර තිබුණි.

එම්.පී. මදුරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එම්.පී.මදුරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

# 4. කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| **විශේෂිත දර්ශක** | **අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම)** | | |
|---|---|---|---|
| | **100%-90%** | **75%-89%** | **50%-74%** |
| පුනරුත්ථාපනයහා වැඩිදියුණු කිරීම | 93.31 | | |
| අත්පත් කරගැනීම් | 90.46 | | |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 95.18 | | |
| **එකතුව** | **92.29** | | |

# 5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 01. සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1.1 ජාතික මට්ටමේ අර්ථ නිරූපනවලට අනුකූලවන පරිදි සියලුම ආකාරයේ දරිද්‍රතාවයන්ගෙන් පෙළෙන සියලුම වයස් කාණ්ඩයන්ට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩු කිරීම. | 1.1.1 ස්ත්‍රී පුරුෂභාවය සහ වයස අනුව ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත්වන ජනගහනයේ අනුපාතය. | | | |
| | | 1.1.2 ජාතික නිර්වචනයන්වලට අනුව දරිද්‍රතාවයේ සියලු මානයන්ට අදාල තත්වය තුල ජීවත් වන සියලු වයස් කාණ්ඩයන්ට අයත් පුරුෂ, ස්ත්‍රී සහ ළමා ජනගහනයේ ප්‍රමාණය. | | | |
| | 1.2 පහළ මට්ටමේ අයද ඇතුලත්ව සියලුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම සහ 2030 වන විට දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමගින් ආවරණය කර තිබීම. | 1.2.1 සමාජ ආරක්ෂණ තල /ක්‍රම මගින් ආවරණය සැපයෙන ජනගහණයේ ප්‍රමාණය. | | | |
| | 1.3 2030 වන විට දරිද්‍රතාවයෙන් පෙළෙන්නන්ගේ සහ අවධානමට ලක්විය හැකි තත්වයේ සිටින්නන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාළගුණික තත්වයන්ගෙන් ඇතිවන හානිකර බලපෑම් ද ආර්ථික සමාජ හා පරිසර වශයෙන් ඇතිවන හානි සහ ආපදාවලට නිරාවරණය වීම ද අඩු කිරීම. | 1.3.1 ජනගහනයේ ලක්ෂයකින් ස්වභාවික ව්‍යසන හේතුවෙන් මියයන අතුරුදහන් වන සහ සෘජුව බලපෑමට ලක්වන පුද්ගලයින් සංඛ්‍යාව | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02. සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | 2.1. 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම. | 2.1.1 මන්දපෝෂණයේ ව්‍යාප්තිය | | | |
| | 2.2 අවුරුදු 5 ට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටි වීම සහ ක්ෂය වීම පිළිබඳ අන්තර් ජාතික වශයෙන් එකඟතාවයට පත්වූ ඉලක්ක 2025 වන විට ළඟා කර ගැනීමද ඇතුළත්ව 2030 වන විට සියලුම ආකාරයේ පවත්නා මන්දපෝෂණ තත්වයන් තුරන් කිරීම සහ නව යොවුන් ගැහැණු ළමුන්ගේ, ගැබිනි මාතාවන්ගේ කිරිදෙන මව්වරුන්ගේ සහ වයස්ගත පුද්ගලයින්ගේ පෝෂණ අවශ්‍යතාවයන්ට විසඳුම් ලබා දීම | 2.2.1 වයස අවුරුදු 5 ට අඩු දරුවන් අතර කුරුභාවයේ ව්‍යාප්තිය ( ලෝක සෞඛ්‍ය සංවිධානයේ ළමා වර්ධන ප්‍රමිතීන්ට අනුව, වයසට අදාල උසෙහි මධ්‍යනය අගයෙන්<-2 සම්මත අපගමනයක්) | | | |
| 03. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබ සාධනය ප්‍රවර්ධනය කිරීම. | 3.1 2030 වන විට බෝ නොවන රෝගනිසා සිදුවන අකල් මරණ ප්‍රතිකාර මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම. | 3.1.1 හෘද නාල ආශ්‍රිත රෝග, පිළිකා, දියවැඩියාව හෝ නිදන්ගත රෝග හේතුවෙන් මියයන ප්‍රමාණය | | | |
| | | 3.1.2 සියදිවි නසා ගැනීම් හේතුවෙන් ජීවිත අහිමි වන ප්‍රමාණය | | | |
| | 3.2 හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය හා අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම | 3.2.1 මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් හටගන්නා අබාධ තත්ත්වය සඳහා ප්‍රතිකාරමය පහසුකම් (ඖෂධමය, මනෝ විද්‍යාත්මක, පුනරුත්තාපනමය සහ රැකබලා ගැනීමේ සේවා) ව්‍යාප්තිය. | | | |
| | | 3.2.2 වර්ෂයක් තුළ වයස අවුරුදු 15 හෝ ඊට වැඩි පුද්ගලයන් අතර ඒක පුද්ගල මධ්‍යසාර පරිභෝජනය | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 04. පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | 4.1 2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමා විය සංවර්ධනය ලබා දීම තහවුරු කිරීම | 4.1.1 ඉගෙනුම් සහ මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් යහපත් සංවර්ධන මාර්ගයකට අවතීර්ණව සිටින වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගේ ප්‍රමාණය. | | | |
| | 4.2 අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම | 4.අ.1 විදුලිය, පානීය ජලය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සැලසීම | | | |
| 05. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමණාකරණය සහතික කිරීම | 5.1 2030 වන විට සියලු දෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකිවීම | 5.1.1 සුරක්ෂිතව කළමනාකරණය කෙරෙන පානීය ජල සැපයුම්සේවා භාවිත කරන ජනගහණයේ ප්‍රමාණය | | | |
| | 5.2 2030 වන විට සියළුම දෙනාටසමානාත්මතාවයෙන් යුතුව සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව ලබා ගැනීමට හැකිවීම. | 5.2.1 ආරක්ෂිතව පාලනය වන සනීපාරක්ෂක සේවා භාවිතාකරන ජනගහනයේ ප්‍රමාණය. | | | |
| 06. සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම තහවුරු කිරීම. | 6.1 2030 වන විට සියලුම දෙනාට අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායී නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකි බවට තහවුරු කිරීම. | 6.1.1 විදුලිය සැපයුම සහිත ජනගහණයේ ප්‍රමාණය | | | |
| | 6.2. 2030 වන විට ලෝක බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්තීන්හි කොටස ඉහළ නැංවීම | 6.2.1 සමස්ථ අවසන් බලශක්ති පරිභෝජනයෙන් පුනර්ජනනීය බලශක්ති පංගුව | | | |
| 07. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. | 7.1 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම | 7.1.1 විවිධ සාධක අනුව පැයක සාමාන්‍ය ආදායම් ඉපැයීම | | | |
| | | 7.1.2 විරැකියා අනුපාතය | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 08. සව්මත් යටිතල පහසුකම් ගොඩනැංවීම, පරිපූර්ණ හා තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම | 8.1 ගුණාත්මක වශයෙන්ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 8.1.1 වසර පුරා භාවිතාකල හැකි මාර්ගයක සිට කි මී 2 ක දුර ප්‍රමාණයක් තුළ ජීවත් වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය. | | | |
| | 8.2 කුඩා පරිමාණ කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවාවන්, ණයලබා ගැනීමේ ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීම සහ එම ව්‍යවසායන් වටිනාකම් දාමයන්ට සහ වෙළඳපොල දාමයන්ට ඒකාබද්ධ කිරීම | 8.2.1 සමස්ත නිෂ්පාදනඅගය එකතු කිරීම්වල පංගුවක් ලෙස කුඩා පරිමාණ නිෂ්පාදන ප්‍රමාණය | | | |
| 09. නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සව්මත් සහ තිරසර ලෙස සකස් කිරීම | 9.1 2030 වන විට සියලු දෙනාට ප්‍රමාණවත් හා ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම | 9.1.1 පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත්වන ජනගහණය | | | |
| | 9.2 ස්වභාවික හා සංස්කෘතිකඋරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කිරීම | 9.2.1 ස්වභාවික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම හාආරක්ෂා කිරීම වෙනුවෙන් කරන සමස්ත ඒක පුද්ගල වියදම | | | |
| 10. තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් සහතික කිරීම | 10.1 2030 වන විට අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම, අඩු කිරීම, සහ ප්‍රතිචක්‍රීකරණය | 10.1.1 ප්‍රතිචක්‍රීකරණ වේගය, ටොන් ගණන | | | |
| 11. දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම | 11.1 කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවන්ට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වවලට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම | 11.1.1 පුද්ගලයින් ලක්ෂයක් අතරින් හදිසි ආපදාහේතුවෙන් සිදුවන මරණ, අතුරුදහන් වන හා සෘජුව බලපෑම්වලට ලක්වන පුද්ගලයින් සංඛ්‍යාව | | | |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

| SDG 17 ඉලක්ක | | වැඩසටහන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වර්ෂය තුල පැවැත්වූ වැඩසටහන් ප්‍රමාණය | මුදල (රු) |
|---|---|---|---|---|---|
| **1** | **දුප්පත්කම නැති කිරීම** | | | | |
| 1.1 | කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා කාන්තාවන් බල ගැන්වීම සඳහා සිදුකරන ලද වැඩසටහන් | දිස්ත්‍රික් කාන්තා දින සමරු වැඩසටහන | 130 | 1 | 40,000 |
| | | කාන්තාවන් / දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 164 | 3 | 198,800 |
| | | වනිතා නවෝදය කාන්තා කාර්ය සංවිධාන සක්‍රීය කිරීමේ වැඩසටහන් | 59 | 2 | 50,000 |
| | | ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් | 42 | 6 | 1,930,000 |
| 1.2 | විගමණික ප්‍රජාවේ සුභසාධනය සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන් | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම | 122 | 3 | 45,000 |
| | | විදේශ රැකියා නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන් | 32 | 1 | 45,000 |
| | | විගමනික ශ්‍රමිකයන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 40 | 1 | 38,000 |
| 1.3 | දිළිදුකම පිටු දැකීම වෙනුවෙන් සමෘද්ධි වැඩසටහන් | ප්‍රතිලාභීන් සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන | 370 | | 17,887,742 |
| | | ප්‍රජාව මනෝසමාජීයව සවිබල ගැන්වීම | | 141 | 2,065,550 |
| | | සමෘද්ධි ප්‍රතිලාභීන්ට සිටි අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම | 207 | | 15,387,484 |
| | | ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් ණය ලබාදීම | 930 | | 125,190,999 |
| | | අලෙවි සංවර්ධන වැඩසටහන | 4123 | 531 | 23,530,050 |
| | | සෞභාග්‍යා නිවාස සංවර්ධන වැඩසටහන | 36 | | 5,400,000 |
| | | සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන | 3174 | | රු.මි. 55.24 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **2** | **කුසගිනි අවසන් කිරීම** | | | | |
| 2.1 | ආහාර සුරක්ෂිතතාවය හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම, ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක් ලෙස කටයුතු කිරීම | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව මගින් දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ගැටලු සඳහා විසදුම් ලබාදීම වෙනුවෙන් කෘෂිකාර්ම ක්ෂේත්‍රයට අදාළ සියලු ආයතන සම්බන්ධීකරණය | | | |
| | | ගොවිජන සේවා කේන්ද්‍ර මට්මින් ආහාර බෝග නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමේ යාන්ත්‍රණය සවිබල ගැන්වීම | | | |
| | | කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම , මෙහෙයවීම හා ඇගයීම. | | | |
| | | වෙනත් අමාත්‍යාංශ යටතේ කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම , මෙහෙයවීම හා ඇගයීම. | | | |
| | | කෘෂිකර්ම සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | |
| 2.2 | ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් කුසගින්න අවසන්කර චිරස්ථායි කෘෂිකර්මයක් ලඟාකර ගැනීම සඳහා දිස්ත්‍රික්කයට අවශ්‍ය පොහොර ප්‍රමාණය සුලබ කිරීම | පොහොර ව්‍යවසායකත්ව ලියාපදිංචි කිරීම් (නව) | 321 | | |
| | | පොහොර ව්‍යවසායකත්ව ලියාපදිංචිය අලුත් කිරීම් | 188 | | |
| | | ක්ෂේත්‍ර මට්ටමින් නියැදි පරීක්ෂාව හා පොහොරවල ගුණාත්මකභාවය තහවුරු කිරීම | 304 | | |
| | | තොග සත්‍යාපනය හා ගබඩා පරීක්ෂාව | 326 | | |
| | | පුහුණු වැඩසටහන් | 150 | | |
| | | පොහොර කමිටු රැස්වීම් / ප්‍රගති සමාලෝචන රැස්වීම | 7.1 | | |
| | | ජාත්‍යන්තර පොහොර දින වැඩසටහන සේවක පුහුණුව | 196 | 1 | 168,680 |
| **3** | **හොඳ සෞඛ්‍ය සහ සුභසාධනය** | | | | |
| 3.1 | වැඩිහිටියන් ආරක්ෂා කිරීමේ සහ බලගැන්වීමේ වැඩසටහන් පැවැත්වීම. | වැඩිහිටි සෞඛ්‍යය ප්‍රවර්ධන වැඩසටහන් | 2386 | 7 | – |
| | | දැනුවත් කිරීමේ වැඩසටහන් | 1930 | 9 | 223,500 |
| | | ආගමික වැඩසටහන් | 757 | 2 | 525,000 |
| | | සවිබල ගැන්වීමේ වැඩසටහන් | 5307 | 9 | 6,100,000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3.2 | දැයේ ජීවනාලිය වන් කුඩා දරුවන්ගේ පූර්ව ළමාවිය සංවර්ධනය | පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාරවේලක් ලබාදීමේ වැඩසටහන-2025 | 7065 | 13 | 16,795,472 |
| | | පෙර පාසල් ගුරුවරුන් සඳහා රු 6000/= ක දීමනාවක් ලබාදීමේ - ගුරු අභිමානී වැඩසටහන | 1730 | 13 | 112,867,000 |
| | | ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා රු 45000/- ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන | 22784 | 13 | 61,510,400 |
| | | යහපත් මාපියභාවය හා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙමාපියන්,පෙර පාසල් ගුරුවරුන් ,ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන | 1117 | 12 | 201,771 |
| | | උත්සව සමය පදනම් කරගනිමින් ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා එක්වරක් පමණක් ලබාදෙන රු 50000.00 ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන | 15729 | 13 | 78,784,971 |
| | | පෙර පාසල් ගුරු පුහුණු වැඩසටහන | 143 | 1 | 62,000 |
| | | ග්‍රාමීය සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයන් දැනුවත් කිරිම හා බලගැන්වීම | 85 | 1 | 50,000 |
| | | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන පිළිබඳ අත්දැකීම් හුවමාරු කිරිමේ දෙමාපිය දැනුවත් කිරීම | 100 | 1 | 40,000 |
| | | පෙර පාසල් ළමුන් සඳහා වන ක්‍රීඩා පාදක වැඩසටහන | 100 | 1 | 170,000 |
| **4** | **ගුණාත්මක අධ්‍යාපනය** | | | | |
| 4.1 | උපදේශනය තුලින් මානසික සංවර්ධනයක් | මත්ද්‍රව්‍ය භාවිතයෙන් හා අන්තර්ජාල ඇබ්බැහියෙන් දරුවන් මුදවා ගැනීම සඳහා දැනුවත් කිරීමේ උපදේශන වැඩසටහන | 1687 | 16 | 240,000 |
| | | නව යොවුන් වියේ ගැබ් ගැනීම් හා සියදිවි නසාගැනීම් වැලැක්වීම සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීමේ උපදේශන වැඩසටහන | 300 | 3 | 45,000 |
| | | මනෝ උපදේශන ගුරුවරුන් සඳහා උපදේශන පුහුණු වැඩසටහන | 50 | 1 | 25,000 |
| 4.2 | ළමා අයිතිවාසිකම් ආරක්ෂාව සම්බන්ධයෙන් හා ළමා සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් | දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව | 389 | 4 | 50,400 |
| | | දිස්ත්‍රික් ළමා සභාව | 256 | 3 | 45,850 |
| | | විශ්ව ළමා දින වැඩසටහන් | 50 | 1 | 10,000 |
| | | දැනුවත් කිරිමේ වැඩසටහන් | 675 | 3 | 180,000 |
| | | ප්‍රගති සමාලෝචන වැඩසටහන් | 165 | 12 | 144,000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **8** | **යහපත් රැකියා සහ ආර්ථික වර්ධනය** | | | | |
| 8.1 | විද්‍යාතා පුහුණු මධ්‍යස්ථානය මගින් සිදුකරන ලද වැඩසටහන් | දැනුවත් කිරීම් හා නිෂ්පාදන පුහුණු වැඩසටහන් | 1199 | 26 | 171,611 |
| 8.2 | යෞවන හා තරුණ ප්‍රජාව බලගැන්වීම සඳහා සිදුකරන ලද වැඩසටහන් | ප්‍රාදේශීය රැකියා පොළ | 1406 | 8 | 160,000 |
| | | Digital marketting programme | 311 | 6 | 326,760 |
| | | Empower Yourth | 169 | 3 | 90,000 |
| | | නිපුණතාවයෙන් වැඩ ලොවට | 240 | 2 | 100,000 |
| | | අවිධිමත් අංශ ව්‍යාපෘති | 380 | 8 | 134,400 |
| | | WORK FORCE SRI LANKA | 250 | 1 | 1,500 |
| **9** | **කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්** | | | | |
| 9.1 | කුඩා ව්‍යාපාර අංශය විසින් ව්‍යවසායකත්ව සංවර්ධනය අරමුණු කොටගත් වැඩසටහන් | ව්‍යවසායකයින්හට සේවා සැපයීමේ දී අවශ්‍යවන ව්‍යාපාර සම්බන්ධ නීති පිළිබඳ නිලධාරි පුහුණු වැඩසටහන | 38 | 01 | 28,160 |
| **10** | **අසමානතා අඩු කිරීම** | | | | |
| 10.1 | දිස්ත්‍රික්කයේ විශේෂ අවශ්‍යතා සහිත පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීම සහ සුභසාධනය | බලගැන්වීමේ වැඩසටහන | 259 | 5 | 78,925 |
| | | දැනුවත් කිරීමේ වැඩසටහන් | 482 | 12 | 219,700 |
| | | ක්‍රීඩා වැඩසටහන් | 468 | 3 | 567,500 |
| | | වෙනත් විශේෂ උත්සව හා ඇගයීමේ වැඩසටහන් | 559 | 10 | 782,500 |
| 10.2 | සැමට සාමය | සමථ මූල මණ්ඩල පුහුණු වැඩසටහන් (ප්‍රා.ලේ කොට්ඨාස මට්ටමින් පස්දින පුහුණුව) | | 7 | 635,100 |
| | | දැනුවත් කිරීමේ වැඩසටහන් | 105 | 3 | 42,000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **13** | **දේශගුණික ක්‍රියාමාර්ග** | | | | |
| 13.1 | දිස්ත්‍රික් ආපදා සහන සැලසීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් | නිවාස හානි සඳහා වන්දි ගෙවීම් | | | 41,854,943.21 |
| | | නිවාස පිරිසිදු කිරීමේ දීමනාව (රු.25000/=) | 76189 | | 1,897,225,000 |
| | | අත්‍යාවශ්‍ය මුලුතැන්ගේ උපකරණ මිලදී ගැනීම (රු.50000/=) | 26335 | | 1,316,750,000 |
| | | පාසල් දරුවන් සඳහා පාසල් පොත් හා ඇඳුම් පැලඳුම් මිලදී ගැනීම (රු.15000/=) | | | 483,120,000 |
| | | මරණ සඳහා වන්දි ගෙවීම් | 19 | | 14,650,000 |
| | | ජීවනෝපාය කටයුතු අඛණ්ඩව සිදුකර ගත නොහැකි පවුල් සඳහා ගෙවනු ලබන දීමනාව (රු. 50000/=) | 54 | | 2,475,000 |
| | | පිසූ ආහාර හා වියළි සලාක ලබා දීම | 346639 | | 544,469,587 |
| | | කුලී දීමනා ගෙවීම් (රු.25000/=) | 138 | | 3,368,000 |
| **16** | **සාමය, නීතිය සහ ශක්තිමත් ආයතන** | | | | |
| 16.1 | ජාතීන් අතර සහයෝගය ඇතිකිරීම | භාෂා වැඩසටහන් | 1394 | 12 | 686,500 |
| | | භාෂා ප්‍රතිපත්තියට අනුව මග පෙන්වීමේ පුවරු සැකසීම | | | 150,000 |
| | | බහුවාර්ගික ආගමික උත්සව හා සංස්කෘතික වැඩසටහන් | 3193 | 25 | 774,080 |
| | | ආර්ථිකය නංවාලීමේ ව්‍යාපෘති | 1398 | 14 | 875,654 |
| | | ආකල්ප සංවර්ධන වැඩසටහන් | 5146 | 32 | 892,831 |

රටක සංවර්ධනයේ පිළිබිඹුව එරට අනාගත ආර්ථික සැලසුම්වල කැඩපතකි. රජය විසින් ගනු ලබන සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට යන ගමනේදී මුහුණ දීමට සිදුවන බාධක ජයගනිමින් එම ඉලක්ක වෙත හඹා යාමට රටේ ශ්‍රම බලකායෙන් හිමිවන්නේ නොමද මෙහෙවරකි.

සංවර්ධනය වූ කලී සත්‍ය වශයෙන්ම ස්ථිරසාර හා ඉලක්කගත අරමුණු වෙත වන ගමනාන්තයක් විය යුතු අතර ජනතාවගේ බලාපොරොත්තු මල් ඵල ගන්වන ස්ථිරසාර ඉලක්ක ගත වූ සංවර්ධන වැඩපිළිවෙලක් විය යුතුමය. එය රටක අනාගත සංවර්ධනයට තෝතැන්නක් වනු නිසැකය.තීන්දු තීරණ ක්‍රියාත්මක කරන ආයතනවල සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම්වල පවතින දූර්වලතා ආයතන අතර පවතින මත ගැටුම් මහජන ක්‍රියාකාරකම් මහජන සහාය ගිලිහී යාම් වැනි හේතූන් මත සංවර්ධන ඉලක්ක වෙත යාමේ දී දැඩි අභායෝගවලට මුහුණ දීමට ද සිදුවනු නිසැකය. එබැවින් සැමවිටම මහජන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් විශේෂයෙන් පාරිසරික සමතුලිතාවය ද ආරක්ෂා කරමින් සිදුවන ආර්ථික සංවර්ධනයන් එතුළින් මහජනතාවයට ලැබෙන ආර්ථික ප්‍රතිලාභයන් සම්බන්ධව වැඩි අවධානයකින් කටයුතු කිරීමට රාජ්‍ය ආයතන ලෙස අප වග බලා ගෙන ඇත.

රට තුළ පැවති දරුණු ආර්ථික අර්බුදය හමුවේ වුව ද රාජ්‍ය ආයතනයක් ලෙස මහජනතාව උදෙසා සිදුකල යුතු සේවාවන් නොපැකිලිව සිදු කිරීමටත් එතුළින් වැඩි ප්‍රතිලාභයක් මහජනතාව වෙනුවෙන් සැපයීමටත් වගකිව යුතු ආයතනයක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අප කැපවී ක්‍රියා කරන ලදි. මෙම ගමනේදී ජයග්‍රාහීව බොහෝ කටයුතු අවසන් කරද්දී දැඩි පරිශ්‍රමයෙන් හා අභියෝග හමුවේ අරමුණු වෙත යාමටද අපට සිදු විය. ජන අවශ්‍යතා හොඳින් හඳුනාගෙන ඔවුනට අත්‍යාවශ්‍යම කාර්යයන් නොපිරිහෙලා ඉටු කරමින් තිරසර සංවර්ධන ගමනේ පෙරළිකාර ගමනක් අවසන් කරමින් දිස්ත්‍රික්කයක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කය ඉහළ ස්ථානයක තැබීමට අවැසි දායකත්වය ලබා දීමට අප කටයුතු කල බව කිව යුතුය.

# 6. මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 15 | 14 | 1 (පුරප්පාඩු) |
| තෘතීයික | 05 | 04 | 1 (පුරප්පාඩු) |
| ද්විතියික | 91 | 123 * | 4 (පුරප්පාඩු) 36 (අතිරික්ත) |
| ප්‍රාථමික | 38 | 37 | 1 (පුරප්පාඩු) |

* කාර්මික නිලධාරි 03ක් සහ කළමනාකරණ සේවා නිලධාරි තනතුරු 01ක් පුරප්පාඩුව පවතින අතර සංවර්ධන නිලධාරි තනතුරු 36ක් අතිරික්තව ඇත.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට අදාල සේවක සංඛ්‍යා විස්තරය<br>2025.12.31 දිනට | | | | | |
|---|---|---|---|---|---|
| අනු අංකය | තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
| 1 | ප්‍රාදේශීය ලේකම් | 13 | 11 | 2 | |
| 2 | සහකාර ප්‍රාදේශීය ලේකම් | 13 | 13 | 0 | |
| 3 | ගණකාධිකාරී | 13 | 12 | 1 | |
| 4 | සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | 11 | 14 | 0 | 3 |
| 5 | සහකාර අධ්‍යක්ෂ (අධිසේවක) | 6 | 10 | 0 | 4 |
| 6 | පරිපාලන නිලධාරී | 13 | 12 | 1 | |
| 7 | පරිපාලන ග්‍රාම නිලධාරී | 13 | 12 | 1 | |
| 8 | භාෂා පරිවර්තක (සිංහල -දෙමළ) | 1 | 0 | 1 | |
| 9 | සංවර්ධන සම්බන්ධීකාරක | 12 | 12 | 0 | |
| 10 | සංවර්ධන නිළධාරී - (කාර්යාලීය)* | 157 | 293 | 0 | 136 |
| 12 | සංවර්ධන නිලධාරි- (වසම්) | 1255 | 1101 | 154 | |
| 13 | කාර්මික නිලධාරී | 26 | 16 | 10 | |
| 14 | කළමනාකරණ සේවා නිලධාරී | 417 | 389 | 28 | |
| 15 | ග්‍රාම නිලධාරී | 1177 | 961 | 216 | |
| 16 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 13 | 8 | 5 | |
| 17 | තාක්ෂණ සහයක | 13 | 12 | 1 | |
| 18 | රියදුරු | 26 | 21 | 5 | |
| 19 | කාර්යාල කාර්ය සහයක | 83 | 68 | 15 | |
| 20 | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහකාර | 1 | 1 | | |
| **එකතුව** | | **3263** | **2966** | **440** | **143** |

* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සැලසුම් අංශයට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම මත නව තනතුරු 85 ක් අනුමත කරදෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත.

* ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් යෝජිත තනතුරු සඳහා අනුයුක්ත සංවර්ධන නිලධාරීන් 52 ද (විමර්ශන නිලධාරී - 2, පරිසර නිලධාරී - 1, සංඛ්‍යාලේඛන නිලධාරී - 1 ලෙස එක් ප්‍රා.ලේ.කාර්යාලයකට නිලධාරීන් 4 බැගින් ප්‍රා.ලේ.කා. 13 ට) ඇතුළුව දැනට සිටින කාර්යාලගත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව ගණනය කර ඇත.

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

රටක සංවර්ධන කාර්යයේදී මානව සම්පත පුරෝගාමී මෙහෙවරක නිරත වන අතර මානව ඉතිහාසය තුළ කලින් කල සංවර්ධනයේ අඩු වැඩි විචල්‍ය සඳහා එහි ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මකභාවයද ඍජු ලෙස බලපා ඇත.

රටක්, ආයතනයක් හෝ සංවිධානයක් සිය ආයතන ඉලක්ක වෙත ගමනාන්තය සනිටුහන් කිරීම උදෙසා ප්‍රතිපත්ති සැලසුම් හා ක්‍රියාකාරකම් බලපාන්නේ යම් සේද ඊට නොදෙවෙනි දායකත්වයක් එම සැලසුම් හා ක්‍රියාකාරකම් ස්ථාපනය කිරීම වෙනුවෙන් දායකවන මානව සම්පත හිමිකම් කියයි.

දැවැන්ත සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීමේදී දායකවන මානව සම්පතේ ගුණාත්මක හැකියාවන් මෙන්ම කාර්යශූරබව, නිපුණත්වය සහ විචක්ෂණභාවය තුළින් සංවර්ධන ඉලක්ක ඵලදායී ලෙස ස්පර්ශ කරමින් මහජන හිතසුව පිණිස එම වැඩසටහන් භාවිතා කර ගත හැකි වන පරිදි සිදුකිරීමෙන්, එම වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතනවල කාර්යසාධනය ඉහළ නංවා ගත හැකිය. සත්‍ය වශයෙන්ම ආයතනයේ සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට තරම් ප්‍රමාණවත් වන මානව සම්පතක හැසිරීම ආයතනයට බරක් නොවනවා සේම රටට ද බරක් නොවේ. එබැවින් අතිරික්ත හෝ ඌණ මානව සම්පතක් ඍජු ලෙසම සංවර්ධන ක්‍රියාවලියට ඍජුවම බාධා පමුණුවයි. එවිට ආයතනය හෝ සංවිධානය ආයතනික කාර්ය සාධන ඵල නිසි පරිදි උපයා ගැනීමට අපොහොසත් වෙයි.

පුද්ගල ශ්‍රමය නිසි ලෙස කළමනාකරණය කිරීම ආයතන පරිපාලනයේ වගකීමකි. එක් එක් ආයතන සිය ආයතනයේ දැක්ම හා මෙහෙවරට ගරු කොට එමඟින් මහජන සේවය සඳහා කැපවී ක්‍රියා කරයි. තව ද, ඉහළ නිපුණතාවයක් මානව සම්පත තුළ ඇති කිරීම තුළින් මානව සම්පතේ, දැනුම, ආකල්ප හා කුසලතා පවතින සේවක සංඛ්‍යාවේ ආකල්ප මුවහත් කිරීම තුළින් වඩා වැඩි ප්‍රතිලාභ අත්කර ගත හැකිය.

වෘත්තීය ජීවිතය තුළ නිදහසේ සිතීමට, අදහස් දැක්වීමට හා සැලසුම් සකස් කිරීම සඳහා නිලධාරියෙකුට හැකි වන්නේ වැඩ පරිසරය තුළ පීඩිත තත්ත්වයක් නොතිබුනහොත් පමණි. නමුත් පුරප්පාඩු පැවතීම හේතුවෙන් ආයතනයක් තුළ එක් නිලධාරියෙකු වෙත පැවරෙන රාජකාරි ප්‍රමාණය වැඩිවන විට ඉහතින් කී නිදහසේ වැඩ කිරීමේ හැකියාව ඔවුන් තුළින් ගිලිහී යනු ඇත. එබැවින් වැඩ ප්‍රමාණයට නිලධාරින් සිටීම ආයතනික කාර්යයන් සාර්ථකව අවසන් කිරීමේදී ඉතා වැදගත් සාධකයකි.

අප ආයතනය සඳහා කාර්මික නිලධාරි තනතුරු 05ක් සහ කාර්මික සහකාර නිලධාරි තනතුරු 02ක් අනුමතව තිබුණද, මහල් 8න් යුතු ලක්සියනෑ මන්දිරය මෙන්ම කඩිනමින් ආරම්භවීමට නියමිත ආසන 1000කින් සමන්විත නව ශ්‍රවණාගාරයේ කටයුතු ද ඉටුකර ගැනීමේ දී කාර්මික නිලධාරින් තිදෙනෙකුගේ පුරප්පාඩුවක් පැවතීම ගැටළුවක්ව ඇත.

එබැවින්, මානව සම්පත මැනවින් කළමනාකරණය කරමින් ආයතනයට බරක් නොවන සේ මහජන හිතසුව වැඩිවන පරිදි කටයුතු කිරීමට ආයතන ප්‍රධානීන් කටයුතු කල යුතුය. යම් රටක ආයතනයක, සංවිධානයක සිය

අභිමතාර්ථ සඵල කර ගැනීම උදෙසා සියලුම සම්පත් රැස් කිරීමත් පොදුවේ තීරණ ගැනීමත් සිදුකරන්නේ මානව සම්පත මඟිනි. එබැවින් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ හා සේවා සැපයීමේදී අන් සම්පත්වලට සාපේක්ෂව මානව සම්පතට සුවිශේෂී ස්ථානයක් හිමිවන බැවින් ඔවුන් අඩු වැඩි නොවී මධ්‍යස්ථව කළමනාකරණය කිරීමෙන් සාර්ථක ආයතනික ප්‍රගතියක් අපේක්ෂා කල හැකිය.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| අනු අංකය | ප්‍රතිපාදන ලැබීම | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | වැඩ මුළු ගණන | සමස්ථ ආයෝජනය ( රු.) | | වැඩසටහනේ ස්භාවය (දේශීය / විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | දේශීය | විදේශීය | | |
| 1 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | නවක ග්‍රාම නිලධාරි සේවාරම්භක පුහුණුව | 10 | මාස 03 | 1 | 118,650.00 | - | දේශීය | එක් එක් මට්ටමේ අවම කාර්ය සාධන පෙන්වන නිලධාරීන්ගේ කාර්ය සාධනය වර්ධනය කර කාර්යක්ෂමතාවය හා ආයතනික ඵලදායිතාවය ඉහළ නැංවීම ප්‍රමුඛ අරමුණ කර ගනිමින් අවශ්‍යතාවයට ගැළපෙන ලෙස උපරිම අයුරින් සිදු කරන ලදී. |
| 2 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 111 පන්තියේ (සීමිත) නිලධාරීන් සඳහා වන සේවාරම්භක පුහුණුව | 15 | දින 10 | 1 | - | - | දේශීය | |
| 3 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වෙබ් අඩවි යාවත්කාලින කිරීම පිළිබඳ පුහුණුව | 16 | දින 02 | 1 | 11,050.00 | - | දේශීය | |
| 4 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | FOUR - I නියමු ව්‍යාපෘතිය පිලිබඳ පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය නිලධාරීන් දැනුවත් කිරීමේ එක් දින වැඩසටහන | 10 | දින 01 | 1 | 12,825.00 | - | දේශීය | |
| 5 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 111 පන්තියේ (විවෘත) නිලධාරීන් සඳහා වන සේවාරම්භක පුහුණුව | 10 | දින 10 | 1 | - | - | දේශීය | |
| 6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ 111 පන්තියේ (විවෘත) නිලධාරීන් සඳහා වන සේවාරම්භක පුහුණුව | 11 | දින 10 | 1 | - | - | දේශීය | |
| 7 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 111 පන්තියේ (විවෘත) නිලධාරීන් සඳහා වන සේවාරම්භක පුහුණුව | 5 | මාස 01 | 1 | - | - | දේශීය | |
| 8 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | කළමනාකරණ සේවා නිලධාරි සේවයේ 1 පන්තියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සඳහා පවත්වනු ලබන පුහුණු පාඨමාලාව | 19 | දින 10 | 1 | 169,580.00 | - | දේශීය | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 9 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිලිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන | 210 | දින 01 | 1 | 28,900.00 | - | දේශිය | |
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | විද්‍යුත්රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) පිලිබඳව නිලධාරීන් පුහුණු කිරීම -1 අදියර | 40 | දින 02 | 1 | 26,800.00 | - | දේශිය | |
| 11 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | විද්‍යුත්රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) පිලිබඳව නිලධාරීන් පුහුණු කිරීම -2 අදියර | 38 | දින 02 | 1 | 26,800.00 | - | දේශිය | |
| 12 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | විද්‍යුත්රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) පිලිබඳව නිලධාරීන් පුහුණු කිරීම -3 අදියර | 38 | දින 02 | 1 | 23,200.00 | - | දේශිය | |
| 13 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | විද්‍යුත්රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) පිලිබඳව නිලධාරීන් පුහුණු කිරීම -4 අදියර | 38 | දින 02 | 1 | 29,000.00 | - | දේශිය | |
| 14 | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | තොරතුරු පනත සම්බන්ධ දැනුවත් කිරීම | 54 | දින 01 | 1 | 58,973.50 | - | දේශිය | |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | AI for Transforming public service | 235 | දින 01 | 1 | 23,000.00 | - | දේශිය | |
| 16 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | PL කාණ්ඩයේ නිලධාරි පුහුණුව | 160 | දින 02 | 1 | 140,800.00 | - | දේශිය | |
| 17 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | ආකල්ප සංවර්ධනය | 200 | දින 01 | 1 | 73,630.00 | - | දේශිය | |
| 18 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | රාජ්‍ය අංශය තුල ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ වැඩමුළුව | 350 | දින 01 | 1 | 171,400.00 | - | දේශිය | |
| 19 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | විධායක නිලධාරීන් සඳහා පවත්වනු ලබන ආතති කළමනාකරණ වැඩසටහන | 100 | දින 01 | 1 | 94,500.00 | - | දේශිය | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 20 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය නිලධාරීන් සඳහා පවත්වනු ලබන ආතති කළමනාකරණ හා රසවින්දන වැඩසටහන | 250 | දින 01 | 1 | 252,800.00 | - | දේශීය |
| 21 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය පුහුණු වැය ශීර්ෂය | Software Development , Network Administration, Information Technology for IT Professionals and Cyber Security | 50 | දින 03 | 1 | 393,001.85 | - | දේශීය |
| 22 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | Seven Mid Career Training Programme | 1 | දින 12 | 1 | - | 134,200.00 | විදේශීය |
| 23 | | Capacity Building Programme on Digital Governance for the Civil Servants of Sri Lanka | 1 | දින 12 | 1 | - | 98,700.00 | විදේශීය |
| 24 | | Capacity Building Programme on Strategic Leadership and Governance for the Civil Servants of Sri Lanka | 1 | දින 12 | 1 | - | 130,300.00 | විදේශීය |
| 25 | | Development of Public - Sector Productivity Specialists | 1 | දින 14 | 1 | - | 106,500.00 | විදේශීය |
| 26 | | Conference on Digital Transformation and Regulatory technology for Improving Public - Sector Productivity | 1 | දින 02 | 1 | - | 163,100.00 | විදේශීය |
| 27 | | Multicountry Observational Study Mission on Principles of the Sufficiency based circular Economy | 1 | දින 05 | 1 | - | 39,000.00 | විදේශීය |

## ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය

නිලධාරීන් වෙත පැවරී ඇති විෂය පථය හරහා දක්ෂතාවයන් හා හැකියාවන් දියුණු කර ගැනිමටත් දුර්වලතාවයන් මඟ හරවා ගැනීමට කටයුතු කිරිමටත් ක්‍රියාකල යුතු ආකාරය වැඩ පරිසරය තුළ නිලධාරියා විසින් හඳුනාගෙන කාර්යක්ෂම සේවාවක් ආයතනය වෙත ලබා දිමට පුහුණු වැඩසටහන් මහත් පිටුවහලක් වේ.

ලෝකය නිරන්තරව වෙනස් වෙන්නේ නිර්මාණශිලි පුද්ගලයන් නිසාය. ඒකාකාරි වැඩ පරිසරයෙන් බැහැරව යමක් සිතා බලා නිසි අයුරින් ඉටු කල හැකි නිර්මාණශීලි නිලධාරී කණ්ඩායමක් බිහි කර ගැනීම පුහුණු වැඩසටහන් මඟින් අපේක්ෂා කෙරේ.

නිවැරදි තිරණ නිවැරදි වේලාවට ගැනිම සඳහා නිලධාරීන් තුල ඇති නිපුණතාවය වර්ධනය කිරීම පුහුණු වැඩසටහන් මඟින් අපේක්ෂා කෙරේ.

ගැටලු විසඳීමේ දි විකල්පයන් පිළිබඳ සිතීමේ වැදගත් ක්‍රම ප්‍රගුණ කිරීමේ අගය පුහුණු වැඩසටහන් අතර තුර සිදු කරන ප්‍රායෝගික ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් නිලධාරීන්ට පැහැදිලි කර දීම.

යම් ගැටළුකාරී අවස්තාවකදී අපක්ෂපාතීව කරුණ තක්සේරු කර වඩාත් නිවැරදි නිගමන වලට එළඹීමේ හැකියාව වර්ධනය කිරීම පුහුණු වැඩසටහන් මඟින් අපේක්ෂා කෙරේ.

අන් අයගේ අදහස් වලට සවන් දීම, තම අදහස් නිවැරදිව පැහැදිලිව සරලව සහ සුහදශීලිව ඉදිරිපත් කිරිම, අන් අයගේ සිත් නොරිදවා තම අදහස් ඉදිරිපත් කිරිම මෙන් ම තමන් නොපිළිගන්නා මෙන් ම නොගැලපෙන කරුණු පිළිබඳව තම අදහස් නොබියව ප්‍රකාශ කිරිමට ඇති හැකියාව වර්ධනය කිරීම.

අන්තර් පුද්ගල සබඳතාවයන් ගොඩනැගිමේ දි මිත්‍රශීලී බව, සුහද බව, සහයෝගය සහ අන්‍යෝන්‍ය ගරුත්වය වැදගත් කොට සැලකිම.

එමෙන්ම පුහුණු වැඩසටහන් තුළින් ආකල්ප සංවර්ධනය, මෘදු කුසලතා සංවර්ධනය හා දෘඩ කුසලතා සංවර්ධනය ඉහළ නැංවීමට දායකත්වය ලබාදෙනු ඇත.

# 07. අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| **2** | **පොත්පත් ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කොට නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවකාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 3 | **මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මුල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4)ඉ උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | - | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළැඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14 | අග්‍රිම ගිණුම | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත් කාර්ය අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය,භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | ආදායම් ගිණුම් | | | |
| 15.1 | අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | මානව සම්පත් කළමනාකරණය | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූල නොවේ | මු.රෙ.71 සඳහා අනුමැතිය ලැබී නොමැත | පවතින අවශ්‍යතාවය අනුව අනුමැතිය ලබා ගැනීම සඳහා ලේඛන යවා ඇත. |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මත කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | ඉදිරියේ දී ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට යෝජිතය |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 20 18.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | - | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |